| සෘජුකෝණාස්‍රය | |
| ත්‍රිකෝණය | |



(120) පහත රූපවල ඇති හැඩ ගණන ලියන්න.



ත්‍රිකෝණ ගණන ...................



වෘත්ත ගණන ...................



සමචතුරස්‍ර ගණන ...................

# බෙදීම

(121) ද්‍රව්‍ය/ රූප ඇසුරෙන් සම සමව බෙදීමේ සංකල්පය තහවුරු කරන්න.

උදා - ටොෆි 6 ක් යහළුවන් අතර සම සමව බෙදන්න.



❖ මේ ආකාරයට ද්‍රව්‍ය ඇසුරින් සම සමව බෙදීමේ ක්‍රියාකාරකම් කිහිපයක දරුවන් යොමු කරවන්න.

(122) සම සමව බෙදන්න. රූප අඳින්න. සංඛ්‍යාව ලියන්න.

★



සංඛ්‍යාව ........................... සංඛ්‍යාව ..................................

★



සංඛ්‍යාව .......................... සංඛ්‍යාව .................................

★



සංඛ්‍යාව ..........................  සංඛ්‍යාව ..................................

(123) පිළිතුරු සපයන්න.

i) 8 ÷ 2 = ....................

ii) 1 0 ÷ 2 = ....................

iii) 1 2 ÷ 2 = ....................

iv) 1 4 ÷ 2 = ....................

v) 1 6 ÷ 2 = ....................

vi) 1 8 ÷ 2 = ....................

vii) 2 0 ÷ 2 = ....................

viii) 2 2 ÷ 2 = ....................

(124) කොටු සැලැස්ම පුරවන්න.

| ÷ | 10 | 12 | 20 |
|---|---|---|---|
| 2 | | | |

| ÷ | 20 | 25 | 30 |
|---|---|---|---|
| 5 | | | |

(125) දීර්ඝ ලෙස බෙදන්න.



**සමානව ගොඩවල් තුනකට බෙදමු.**

| දහයේ ඒවා | එකේ ඒවා |
|---|---|
|  |  |

ගණක පෙත ඇසුරින් මේ ආකාරයේ ක්‍රියාකාරකම් කිහිපයක දරුවන් යොදවමින් බෙදීම තහවුරු කරන්න.

| දහයේ ඒවා | එකේ ඒවා |
|---|---|
|  |  |

| දහයේ ඒවා | එකේ ඒවා |
|---|---|
|  |  |

| දහයේ ඒවා | එකේ ඒවා |
|---|---|
|  |  |

එක ගොඩකට 11 යි

(126) පෙට්ටියේ ඇති බෝල 15 සමාන ව ගොඩවල් 3කට වෙන් කරන්න.



එක් ගොඩකට බෝල කීය ද? .............

(127) වගුව සම්පූර්ණ කරන්න.

| ÷ | 15 | 18 | 30 | 33 |
|---|---|---|---|---|
| 3 | | | | |

(128) දීර්ඝ ලෙස බෙදන්න.




(129) 4 න් බෙදා පිළිතුර ලියන්න.





16 ÷ 4 = ...................

24 ÷ 4 = ...................

(130) නිවැරදි පිළිතුර තෝරා යා කරන්න.

| | |
|---|---|
| 20 ÷ 4 | 20 |
| 32 ÷ 4 | 10 |
| 40 ÷ 4 | 12 |
| 48 ÷ 4 | 05 |
| 80 ÷ 4 | 08 |

සංඛ්‍යාව ලොකුයි. ඒත් බෙදන්න හරි ලේසියි.



$440 \div 4 = 110$

ගණක පෙත ඇසුරින් මේ ආකාරයට 4 න් බෙදීම තහවුරු කරන්න.

(131) දීර්ඝ ලෙස බෙදන්න.

| | | | |
|---|---|---|---|
| 4 ⟌ 4 4 | 4 ⟌ 8 0 | 4 ⟌ 8 8 | 4 ⟌ 4 8 0 |

(132) ශාලාවක පුටු 36 කි ඇත. එම පුටු පේළි හතරකට සාදා තැබූ විට එක් පේළියකට පුටු කීය ද?

(133) බිස්කට් 120 ක් පැකට් 4 ට වෙන් කර දැමූ විට එක් පැකැට්ටුවක බිස්කට් කීය ද?

# <u>මුදල්</u>

- කාසි හඳුනා ගැනීම සඳහා කාසි භාවිත කරමින් ක්‍රියාකාරකම්වල යොදවන්න.

(134) පහත සඳහන් කාසි මාරු කළ හැකි ආකාර ලියමු.




(135) පහත සඳහන් භාණ්ඩවල මිල කාසි මගින් ගෙවිය හැකි ආකාරය ලියන්න.



උදා :




රු. 5 .00



රු. 7 .00



රු. 12 .00



රු. 14 .00

(136) නිවැරදි පිළිතුර තෝරා යා කරන්න.

i. 10. 00

ii. 12.00

iii. 20.00

iv. 17.00

v. 11.00
















(137) කැටයට එකතුවන මුදල සොයන්න.

i)




රුපියල් .........................

ii)




රුපියල් .........................

iii)




රුපියල් .........................

- සිසුන් එළිමහනට කැඳවාගෙන ගොස් මුදල් නෝට්ටු හඳුනා ගැනීමේ ක්‍රියාකාරකම් සිදු කරන්න.
- අනුයෝගී මුදල් නෝට්ටු සහ මුදල් නෝට්ටුවල අගය ලියන ලද කාඩ්පත් සකසා ගන්න. සිසුන් A සහ B ලෙස කණ්ඩායම් කර ක්‍රියාකාරකම්වල යොදවන්න.

උදා : A B

| රුපියල් පනහයි |  |
| රුපියල් සියයයි |  |

(138) පහත භාණ්ඩ මිලදී ගත හැකි ආකාරය නෝට්ටුවලින් දක්වන්න.

i.  රුපියල් 30.00 =

ii.  රුපියල් 40.00 =

iii.  රුපියල් 70.00 =

iv.  රුපියල් 80.00 =

(139) පහත භාණ්ඩවල මිල ගෙවිය හැකි ආකාරය ලියා දක්වන්න.

උදා :  +  =

රු. 20.00 + රු. 20.00 = | රුපියල් 20.00 | + | රුපියල් 20.00 |

 + 

රුපියල් 15 + රුපියල් 15 =

 + 

රුපියල් 40 + රුපියල් 50 =

 + 

රුපියල් 60 + රුපියල් =

 + 

රුපියල් 30 + රුපියල් 70 =

(140) නිවැරදි මුදල් නෝට්ටුව සොයා යා කරන්න.

රුපියල් 20.00

රුපියල් 50.00

රුපියල් 500.00

රුපියල් 100.00









(141) සෙල්ලම් කඩයක් ඇසුරින් ගැටලු විසඳීමට යොමු කරන්න.

( මේ සඳහා අනුයෝගී නෝට්ටු හා කාසි භාවිත කරන්න.)

<u>මිල දර්ශනය</u>



රුපියල් 20.00




රුපියල් 45.00



රුපියල් 35.00



රුපියල් 62.00



රුපියල් 15



රුපියල් 7.00



රුපියල් 12.00




රුපියල් 9.00

මිල දර්ශනය ඇසුරින් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. පොතක මිල කීය ද? ..........................................................................

ii. පාට පෙට්ටියක මිල කීය ද? ............................................................

iii. කටරයක මිල කීය ද? ..........................................................................

iv. පැන්සලක් හා කෝදුවක මිල කීය ද? ..................................................

v. ගම් බෝතලයක් හා පෑනක මිල කීය ද? ..............................................

vi. පාට පෙට්ටියක හා ගම් බෝතලයක මිල කීය ද? ..............................

vii. මකනයක සහ පොතක මිල කීය ද? ................................................

(142) ඉතුරු මුදල සොයන්න.

| භාණ්ඩයේ මිල | දුන් මුදල | ඉතුරු මුදල |
|---|---|---|
|  පෑනක මිල රුපියල් 20.00 | රුපියල් 50.00 | |
|  කටරයක මිල රුපියල් 8.00 | රුපියල් 10.00 | |
|  පොතක මිල රුපියල් 35.00 | රුපියල් 50.00 | |
|  පාට පෙට්ටියක මිල රුපියල් 62.00 | රුපියල් 100.00 | |

(143) පහත කාසියේ නම අකුරෙන් ලියන්න.

i.  ..............................................

ii. 

..............................................

iii. 

.................................................

iv. 

...................................................

(144) පහත කාසි හා නෝට්ටුවල එකතුව ලියන්න.

i. රුපියල් 20   (රු. 2) = ..................................

ii. රුපියල් 50 + (රු. 5) = ..................................

iii. රුපියල් 20 + (රු. 5) + (රු. 2) = ..................................

iv. රුපියල් 50 + (රු. 1) + (රු. 10) = . ..................................

v. රුපියල් 100 + (රු. 5) + (රු. 2) + (රු. 1) = ...............................

(145) කාසි හා නෝට්ටුවල වටිනාකම අනුව යා කරන්න.

i.රුපියල් 22.00



ii.රුපියල් 90.00



iii.රුපියල් 70.00



iv.රුපියල් 56.00



v.රුපියල් 82.00



(146) ඉතුරු මුදල සොයන්න.

I.  රුපියල් 125.00

දුන් මුදල = රුපියල් 200.00 ඉතුරු මුදල = ....................................

II.  රුපියල් 35.00

දුන් මුදල = රුපියල් 50.00 ඉතුරු මුදල = ....................................

III.  රුපියල් 175.00

දුන් මුදල = රුපියල් 175.00 ඉතුරු මුදල = ....................................

# රෝම සංඛ්‍යා

> සිසුන් කණ්ඩායම් කොට ගිනිකූරු හෝ ඉරටු යොදා ගෙන 1 සිට 5 දක්වා හින්දු අරාබි සංඛ්‍යාවලට අදාළ රෝම සංඛ්‍යා නිරූපණය කිරීමට ලබා දීම.

(147) පහත රෝම සංඛ්‍යාවලට අදාළ හින්දු අරාබි සංඛ්‍යා ලියන්න.

i. ............................
ii. ..........................
iii. ............................
iv. ............................
v. ...........................

(148) පහත හින්දු අරාබි සංඛ්‍යාවලට අදාළ රෝම සංඛ්‍යා ලියන්න.

- 1 .............................
- 2 .............................
- 3 .............................
- 4 .............................
- 5 .............................

(149) නිවැරදි ලෙස යා කරන්න.

| | |
|---|---|
| 1 | v |
| 2 | ii |
| 3 | i |
| 4 | iv |
| 5 | iii |

(150) හිස්තැන් පුරවන්න.

| රෝම සංඛ්‍යාංකය | v | i | iv | | |
|---|---|---|---|---|---|
| හින්දු අරාබි සංඛ්‍යාංකය | | | | 2 | 3 |

(151) පහත සංඛ්‍යා එකතුකර පිළිතුර රෝම සංඛ්‍යාවලින් ලියා දක්වන්න.

i. 1 + 1 = .....................

ii. 2 + 3 = .....................

iii. 2 + 2 = .....................

iv. 1 + 4 = .....................

v. 2 + 1 = .....................

| |
|---|
| සිසුන් කණ්ඩායම් කොට ගිනිකූරු හෝ ඉරටු යොදා ගෙන පෙර පරිදි ම 5 සිට 10 දක්වා හින්දු අරාබි සංඛ්‍යාවලට අදාළ රෝම සංඛ්‍යා නිරූපණය කිරීමට ලබා දීම. |

(152) සංඛ්‍යා නාමයට අදාළ රෝම සංඛ්‍යාංකය යා කරන්න.

| | |
|---|---|
| පහ | viii |
| හත | x |
| අට | vii |
| හය | vi |
| දහය | v |
| නවය | ix |

(153) දී ඇති රෝම සංඛ්‍යාවලට පෙර හා පසු රෝම සංඛ්‍යාව ලියන්න.

................. v ...................

................. vi ...................

................. vii ...................

................. viii ...................

................. ix ...................

................. x ...................

(154) පහත හින්දු අරාබි සංඛ්‍යාවල එකතුව රෝම සංඛ්‍යාවෙන් ලියන්න.

i. 6 + 1 = ....................

ii. 3 + 2 = ....................

iii. 6 + 4 = ....................

iv. 5 + 3 = .....................

v. 4 + 5 = ......................

(155) පෝච්චියේ මල් ගණන් කර රෝම සංඛ්‍යාවෙන් ලියන්න.


....................


.....................


..................


....................


....................


.....................


..................


....................

(156) දී ඇති සංඛ්‍යාවට අදාළ එකක් අඩු සංඛ්‍යාව රෝම ඉලක්කමෙන් ලියන්න.

| | | | |
|---|---|---|---|
| 7 | ............................ | 3 | ............................ |
| 10 | ............................ | 4 | ............................. |
| 2 | ............................ | 5 | ............................. |
| 6 | ............................ | 8 | ............................. |
| 9 | ............................ | 1 1 | ............................. |

<u>**දිශා**</u>

★ වම්පස හා දකුණුපස හඳුනා ගැනීම සඳහා සිසුන් එළිමහනට කැඳවාගෙන ගොස් ක්‍රියාකාරකමක නිරත කරවන්න.

<u>ඉදිරියට හැරී සිටින විට,</u>

**දකුණු පස**



**වම් පස**

<u>පසුපසට හැරී සිටින විට,</u>

**වම් පස**



**දකුණු පස**

තමාගේ දෙපසින් (වම් පස හා දකුණු පසින්) සිටින අය නම් කිරීම

**නයනා**



**අමර**

(157) පහත උපදෙස් කියවා බලා දිශාව තේරුම් ගෙන පින්තූර අඳින්න.

i. ගීතාගේ වම් අත පැත්තෙන් මලක් අඳින්න.

ii. ගීතාගේ දකුණු අත පැත්තෙන් බෝලයක් අඳින්න.



i. අමල්ගේ දකුණු අත පැත්තෙන් කාරයක් අඳින්න.

ii. අමල්ගේ වම් අත පැත්තෙන් කුඩයක් අඳින්න.



(158) පහත පින්තූරය දෙස බලා පිළිතුරු සපයන්න.




i. නිවසේ සිට ඉදිරියට ගොස් වමට හැරෙන්න. හමු වන්නේ කුමක් ද?

.......................................................................................................................

ii. නිවසේ සිට ඉදිරියට ගොස් දකුණට හැරෙන්න. හමු වන්නේ කුමක් ද?

.......................................................................................................................

(159) රූපය බලා උපදෙස් අනුව ක්‍රියාකාරකමෙහි  නිරත වන්න.

  

i. මාලාගේ දකුණු පසින් ඇත්තේ .................................... එය කහ පාටින් පාට කරන්න.

ii. මාලාගේ වම් පසින් ඇත්තේ .................................... එය නිල් පාටින් පාට කරන්න.

**ප්‍රධාන දිශා නිවැරදි ව හඳුනා ගැනීම.**

* මේ සඳහා සිසුන් එළිමහනට රැගෙන ගොස් ප්‍රබෝධාත්මක ක්‍රියාකාරකමක නිරත වන්න.
* හිරු නැගෙන දිශාවට හැරී සිට ගන්න.
* හිරු නැගෙන දිශාව නැගෙනහිර බව හඳුන්වා දෙන්න.
* ඊට ප්‍රතිවිරුද්ධ දිශාව බස්නාහිර බව පෙන්වා දෙන්න.
* නැගෙනහිරට හැරී සිටින විට

  දකුණු අත පැත්ත - දකුණු දිශාව

  වම් අත පැත්ත - උතුරු දිශාව (මෙය ක්‍රීඩාවක් ලෙස කරන්න.)




(160) ක්‍රියාකාරකමට අදාළව ප්‍රශ්න අසන්න.

i. හිරු නැගෙන දිශාව කුමක් ද? ..........................................................................................

ii. ඊට ප්‍රතිවිරුද්ධ දිශාව කුමක් ද? ...................................................................................

iii. නැගෙනහිර දිශාවට හැරී සිටගත් විට දකුණු අත පැත්ත කුමන දිශාව ද? .......................

iv. නැගෙනහිර දිශාවට හැරී සිටගත් විට දකුණු අත පැත්ත කුමන දිශාව ද? .......................

(161) මෙය හඳුන්වා දෙන්න.




(162)



i. ගසට උතුරු දිශාවෙන් කුරුල්ලෙක් අඳින්න.

ii. ගසට නැගෙනහිර දිශාවෙන් නිවසක් අඳින්න.

iii. ගසට දකුණු දිශාවෙන් කාර් එකක් අඳින්න.

iv. ගසට බස්නාහිර දිශාවෙන් හාවෙක් අඳින්න.

(163)



i. නිවසට උතුරින් ඇත්තේ ..................

ii. නිවසට දකුණින් ඇත්තේ ............................................

iii. නිවසට බස්නාහිරින්ඇත්තේ ............................................

iv. නිවසට නැගෙනහිරින් ඇත්තේ ........................................

(164)




i. පොලීසියට උතුරු දිශාවෙන් ............................................. පිහිටා තිබේ.

ii. පොලීසියට නැගෙනහිර දිශාවෙන් ...................................... පිහිටා තිබේ.

iii. පාසලට බස්නිහිර දිශාවෙන් ........................................ පිහිටා තිබේ.

(165)



i. නිවසේ සිට කුඹුරට යනවිට උතුරට කීවාරයක් යා යුතු ද? ........................................

ii. නිවසේ සිට කුඹුරට යනවිට නැගෙනහිරට හැරෙන වාර ගණන කීය ද?......................

iii. නිවසේ සිට කුඹුරට යනවිට දකුණට හැරිය යුතු වාර ගණන කීය ද? ..........................

(166)




i. A ට උතුරින් ඇත්තේ ............................................

ii. A ට දකුණින් ඇත්තේ ...........................................

iii. C ට බස්නාහිරින් ඇත්තේ ................................ හා ................................

iv. A ට දකුණින් ඇත්තේ .............................................

# පරිමාව

★ විවිධ හැඩැති භාජන කිහිපයක් හා අභිමත ඒකක කිහිපයක් ගෙන භාජනවලට අල්ලන ජල ප්‍රමාණ මැනීමට ලබා දීම. අභිමත ඒකක ලෙස යෝගට් කෝප්ප, පොල්කටු යොදා ගත හැකිය.

**මිනුම් සරා භාවිතයෙන් සම්මත ඒකකය $\ell$ ලෙස හඳුන්වා දීම.**

(167) එක් එක් අවස්ථාවේ භාජනවල අල්ලන ද්‍රව ප්‍රමාණ දක්වන්න.




| භාජනය | අල්ලන ජල ප්‍රමාණය |
|---|---|
| A | |
| B | |
| C | |
| D | |
| E | |

(168) පහත දැක්වෙන භාජන පිරවීමට A භාජනයෙන් දැමිය යුතු ද්‍රව ප්‍රමාණය දක්වන්න.




............................ ................................... ..............................

(169) පහත භාජනවල ඇති ජල ප්‍රමාණ ඇසුරින් පහත ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.




i. මෙහි අඩු ම ජල ප්‍රමාණයක් ඇති භාජනය කුමක් ද? ..................................................

ii. වැඩි ම ජල ප්‍රමාණයක් අල්ලන භාජනයේ ඇති ජල ප්‍රමාණය කොපමණ ද? ................

iii. D භාජනය පිරවීමට C භාජනයෙන් දැමිය යුතු වාර ගණන කොපමණ ද? ....................

iv. මෙහි භාජන දෙකක ජල ප්‍රමාණයන් එකතු කළ විට A භාජනයේ ජල පරිමාවට සමාන වේ. එම භාජන දෙක මොනවා ද? ..............................................................................

දුව මනින සම්මත ඒකක

- ★ *mℓ* - මිලි ලීටරය (1000 *mℓ*)
- ★ *ℓ* - ලීටරය බව හඳුන්වා දිය යුතු ය. 1 *ℓ* = 1000 *mℓ*

( ලීටරයට අඩු දුව ප්‍රමාණ මැනීම සඳහා මිලි ලීටරය භාවිත කළ යුතු බව හඳුන්වා දෙන්න.)

(170) සම්මත සංකේතය ලියන්න.

i. ලීටර 2 ..........................................
ii. ලීටර 5 ..........................................
iii. ලීටර 8 ..........................................
iv. මිලිලීටර 200 ..........................................
v. මිලිලීටර 400 ..........................................

(171) පහත මිලි ලීටරවලින් දැක්වෙන ප්‍රමාණ ලීටරවලින් දක්වන්න.

i. 1000 *mℓ* ....................................
ii. 3000 *mℓ* ....................................
iii. 5000 *mℓ* ....................................
iv. 7000 *mℓ* ....................................
v. 8000 *mℓ* ....................................

(172) පහත දුව ප්‍රමාණ ලීටර හා මිලි ලීටරවලින් දක්වන්න.

i. 1250 *mℓ* ....................................
ii. 2800 *mℓ* ....................................
iii. 3700 *mℓ* ....................................
iv. 5200 *mℓ* ....................................
v. 8300 *mℓ* ....................................

(173) හිස්තැන් පුරවන්න.

i. 1850 *ℓ* = 1*ℓ* .................... *mℓ*
ii. .................. =3*ℓ* 870 *mℓ*
iii. 6500 *mℓ* = 6*ℓ* .................... *mℓ*
iv. .................. =8*ℓ* 070 *mℓ*
v. 2007 *mℓ* = ..........*ℓ* .................... *mℓ*

(174) එකතු කරන්න.

(i)

| $\ell$ | $m\ell$ |
|---|---|
| 1 | 400 |
| + 1 | 100 |
| | |

(ii)

| $\ell$ | $m\ell$ |
|---|---|
| 2 | 300 |
| + 3 | 300 |
| | |

(iii)

| $\ell$ | $m\ell$ |
|---|---|
| 2 | 200 |
| + 5 | 600 |
| | |

(iv)

| $\ell$ | $m\ell$ |
|---|---|
| 6 | 500 |
| + 2 | 600 |
| | |

(v)

| $\ell$ | $m\ell$ |
|---|---|
| 2 | 450 |
| + 4 | 820 |
| | |

(175) අඩු කරන්න.

(i)

| $\ell$ | $m\ell$ |
|---|---|
| 3 | 500 |
| - 1 | 200 |
| | |

(ii)

| $\ell$ | $m\ell$ |
|---|---|
| 2 | 300 |
| - 1 | 100 |
| | |

(iii)

| $\ell$ | $m\ell$ |
|---|---|
| 3 | 750 |
| - 2 | 500 |
| | |

(iv)

| $\ell$ | $m\ell$ |
|---|---|
| 5 | 620 |
| - 2 | 110 |
| | |

(v)

| $\ell$ | $m\ell$ |
|---|---|
| 4 | 750 |
| - 1 | 800 |
| | |

# බර මැනීම

★ විවිධ ප්‍රමාණයෙන් පුරවන ලද වැලි මලු කිහිපයක් සපයා ගන්න.

★ බර ප්‍රමාණය හඳුන්වා දීමට තරාදි හා සපයාගත් වැලි මලු ඇසුරින් ක්‍රියාකාරකමක නිරත කරවන්න.

★ විවිධ බරින් යුත් ද්‍රව්‍ය කිහිපයක් සපයා ගන්න. සැබෑ තරාදියක් ද යොදා ගන්න.



A B

- බර වැඩි A පැත්තේ ද්‍රව්‍ය බව හඳුන්වා දෙන්න. (තරාදියේ පහත්වන පැත්ත)
- බර අඩු B පැත්තේ ද්‍රව්‍ය බව හඳුන්වා දෙන්න. (තරාදියේ ඉහළ යන පැත්ත)

(176) නිවැරදි පිළිතුරු ලියන්න / තෝරන්න.

A B C



i. සමාන බර ඇති පිළිතුර සහිත තරාදිය කුමක්ද? ………………………………

ii. කෙසෙල් ඇවරි දෙකෙහි බරට වඩා කෙසෙල් ඇවරියේ බර (වැඩියි/අඩුයි)

iii. ගස්ලබු ගෙඩියේ බර වට්ටක්කා ගෙඩියේ බරට වඩා (අඩුයි/ වැඩියි)

- බර මැනීමේ සම්මත ඒකකය හඳුන්වා දීම සඳහා 1kg පඩිය යොදා ගනිමින් ක්‍රියාකාරකම් කිහිපයක් සැලසුම් කර ගන්න.

උදා:



(1kg ක් බර වැලි මල්ල) (1kg මිනුම් පඩිය)

1kg යනුවෙන් දැක්වෙන්නේ කිලෝග්රෑම් එකක් බව හඳුන්වා දෙන්න.

| |
|---|
| කිලෝ ග්රෑම් එක - 1kg |
| බර මැනීමේ සම්මත ඒකකය |

(177) වගුව සම්පූර්ණ කරන්න.



සහල්



වට්ටක්කා



අන්නාසි



පරිප්පු



කෙසෙල්

| ද්‍රව්‍යය | බර | kg |
|---|---|---|
| අන්නාසි | කිලෝග්රෑම් එක | 1kg |
| | | |
| | | |
| | | |
| | | |

(178) රූප දෙස බලා වගුව සම්පූර්ණ කරන්න.

| ද්‍රව්‍යය | බර 1kg ට වඩා වැඩි | බර 1kg ට වඩා අඩු | බර 1kg ට සමාන |
|---|---|---|---|
| සීනි | | | |
| තේ කොළ | | | |
| සැමන් | | | |
| අන්නාසි | | | |

- බර මැනීම සඳහා යොදා ගන්නා මිනුමක් ලෙස පඩි හඳුන්වා දෙන්න.

(5g සිට 500g තෙක්)

1. සැබෑ ද්‍රව්‍යය යොදා ගන්න.
2. තරාදිය
3. 500g පඩි 2 ක්
4. 1kg පඩි 1 ක්



(500g පඩි 2යි) (1kg පඩි 1ක්)

500 g + 500 g = 1 kg

1000 g = 1 kg බව හඳුන්වා දෙන්න.

(179) සම්මත සංකේතය යොදා ලියන්න.

i. ග්‍රෑම් 100 = ............................................
ii. ග්‍රෑම් 250 = ............................................
iii. ග්‍රෑම් 400 = ............................................
iv. කිලෝග්‍රෑම් 5 = ............................................
v. කිලෝග්‍රෑම් 2 = ............................................

(180) ග්‍රෑම්වලින් ලියන්න.

i. 1 kg = …………………………
ii. 5 kg = …………………………
iii. 3 kg = …………………………

(181) යා කරන්න.

| | |
|---|---|
| i. 3 kg | 2400 g |
| ii. 1kg 100 g | 3000 g |
| iii. 2 kg 500g | 5000 g |
| iv. 5 kg | 2500 g |
| v. 2 kg 400g | 1100 g |




(182) ඉහත දැක්වෙන පඩි පමණක් භාවිත කර දී ඇති බර ප්‍රමාණය මැනිය හැකි ආකාරයන් ලියන්න.

උදා - 100g = 50g + 50g

i. 150g = ………….. + ………….. + …………..
ii. 200 g = ………….. + ………….. + …………..
iii. 250 g = ………….. + ………….. + …………..
iv. 1 kg 500 g = ………….. + ………….. + …………..
v. 5 kg = ………….. + ………….. + …………..

(183) කිලෝග්‍රෑම් සහ ග්‍රෑම්වලින් ලියන්න.

උදා - 1500g = 1 kg 500 g

i. 2500 g = …………………………………
ii. 3250 g = …………………………………
iii. 5150 g = …………………………………

(184)




i. සහල් පැකැට්ටුවේ බර කිලෝග්‍රෑම් කීය ද?
……………………………………………………………………………………………
ii. සබන් කුඩු සහ කිරිපිටි පැකැට්ටුවල මුළු බර කොපමණ ද?
……………………………………………………………………………………………

iii. ග්‍රෑම්වලින් පමණක් බර දැක්වෙන ද්‍රව්‍යය දෙක මොනවා ද?
……………………………………………………………………………………………

iv. බර අඩුම ද්‍රව්‍යය කුමක්ද? ……………………………………………………………

(185) ද්‍රව්‍ය දෙකෙහි බර එකතු කර ලියන්න.

i. 


ii. 


……………………………………..

……………………………………..

iii. 


……………………………………

(186) එකතු කරන්න.

(i)

| kg | g |
|---|---|
| 2 | 200 |
| 3 | 400 |

(ii)

| kg | g |
|---|---|
| 1 | 650 |
| 2 | 150 |

(iii)

| kg | g |
|---|---|
| 3 | 815 |
| 2 | 510 |

(187) අඩු කරන්න.

(i)

| kg | g |
|---|---|
| 6 | 250 |
| 4 | 150 |

(ii)

| kg | g |
|---|---|
| 5 | 575 |
| 2 | 350 |

(iii)

| kg | g |
|---|---|
| 3 | 350 |
| 1 | 500 |

(188) i 500g බර සීනි පැකැට්ටුවකින් 200g ක් පාවිච්චි කළ පසු ඉතිරි සීනි ප්‍රමාණය කොපමණද ? ……………………………………………………………………………………

ii. වෙළඳසැලක පාන් පිටි 4kg 800g ක ප්‍රමාණයකින් 2kg 500 g ක ප්‍රමාණයක් විකුණන ලදී. ඉතිරි පාන් පිටි ප්‍රමාණය කොපමණ ද? ……………………………………………………………

iii. ගොවියෙක් මෑ කරල් 3kg 250 g ක් ද බතල 4kg 700 g ද පොළට ගෙනයන ලදී. පොළට ගෙනයන ලද ද්‍රව්‍යවල මුළු බර කොපමණ ද? ……………………………………………

## ප්‍රස්තාර

- ✓ සිසුන් එළිමහනට කැඳවාගෙන යන්න.
- ✓ සුදුසු පරිදි කොටු සැලැස්මක් සූදානම් කර ගන්න.
- ✓ පාට තුනකින් යුත් මල් / ටොනික් මූඩි / කඩදාසි වෘත්ත රැස් කර ගන්න.

| | | |
|---|---|---|
| | | |
| උදා. නිල් මල් | රතු මල් | කහ මල් |

- ✓ වරකට එක් සිසුවෙකු අහඹු ලෙස කැඳවා ගුරු උපදෙස් අනුව අදාළ තීර මත (මල්) ද්‍රව්‍ය තැබීමට යොමු කරන්න.
- ✓ තීරවල ඇති මල් සංඛ්‍යා පිළිබඳ සිසුන් සමග සාකච්ඡා කරන්න.

( 189) රූප ප්‍රස්තාරයට අනුව අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




i. වැඩියෙන් ම ඇති වාහන වර්ගය කුමක් ද? ..................................

ii. අඩුවෙන් ම ඇති වාහන වර්ගය කුමක් ද? ....................................

iii. පා පැදි ගණන කීය ද? ..........................................................

(190) ප්‍රස්තාරය ඇසුරින් පිළිතුරු සපයන්න.

| පලතුරු වර්ගය | වාර ගණන | කැමති සිසුන් ගණන |
|---|---|---|
| අන්නාසි | ///// /// | 8 |
| අඹ | ///// / | 6 |
| කෙසෙල් | ///// | 5 |

i) ඉහත තොරතුරු ඇසුරින් ප්‍රස්තාරය ගොඩනගන්න.

| | | | |
|---|---|---|---|
| 9 | | | |
| 8 | | | |
| 7 | | | |
| 6 | | | |
| 5 | | | |
| 4 | | | |
| 3 | | | |
| 2 | | | |
| 1 | | | |
| | අන්නාසි | අඹ | කෙසෙල් |

ii) අඹ සහ අන්නාසිවල එකතුව කීය ද? ..........................................................................

iii) කෙසෙල්වලට වඩා අන්නාසි ගෙඩි කීයක් තිබේ ද? .......................................................

(191) ක්‍රියාකාරකම සඳහා දාදු කැටයක් යොදා ගන්න. ඒ ඇසුරින් දත්ත වගුව සකස් කර ගන්න. (වාර 20 ක් පමණ දාදු කැටය උඩ දමන්න.)

| දාදු කැටයේ පැත්ත | වාර ගණන | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | | |
| 2 | | |
| 3 | | |
| 4 | | |
| 5 | | |
| 6 | | |

- ලැබුණු දත්ත ඇසුරින් තීර ප්‍රස්තාරය ගොඩ නගන්න.

(192) ප්‍රස්තාරය ඇසුරින් පිළිතුරු සපයන්න.




i. ඉහත තීර ප්‍රස්තාරය සඳහා සුදුසු මාතෘකාවක් යොදන්න.

..........................................................................................................................................

ii. වැඩියෙන් ම සිටින සතුන් වර්ගය කුමක් ද?..............................................................

iii. සමානව සිටින සතුන් වර්ග මොනවා ද?....................................................................

iv. වැඩියෙන් ම සිටින හා අඩුවෙන් ම සිටින සතුන් වර්ග අතර වෙනස කීය ද? .................

v. මුළු සතුන් ගණන කීය ද? ....................................................................................

# මව්බස

## පිල්ලම්

**<u>ක්‍රියාකාරකම</u>**

සී.ඩී තැටිවල හෝ කාඩ්බෝඩ් රවුම්වල පිල්ලම් සහ ශබ්ද ලියා මාලයක් සේ එල්ලා ගත හැකි පරිදි සකස් කරගන්න.

උදා:-

**ඉස්පිල්ල** | **දික් ඉස්පිල්ල** | **ඇලපිල්ල**

**ආ** | **ර්** | **ඉ**

- මේවා දරුවන්ට පැළඳ ගැනීමට සලස්වන්න.
- පිල්ලම එල්ලා ඇති සිසුවා එය ශබ්ද නගා කියවන අතර ඊට අදාළ ශබ්දය එල්ලා ඇති සිසුවා දුව විත් අත අල්ලා ගැනීම.
- සිසු යුගලය විසින් තමන් එල්ලා ගෙන සිටින පිල්ලම හා ඊට අදාළ ශබ්දය ශබ්ද නගා කියවන්නට යොමු කරන්න.

- පිල්ලම පමණක් ලියු කාඩ්පත් පමණක් සකස් කර ගන්න.
- ඒ සියල්ල පෙට්ටියකට දමන්න.

උදා:-





- වරකට කෙනෙකු බැගින් ඉදිරියට දිවගොස් පෙට්ටියෙන් පිල්ලමක් රැගෙන එය ශබ්ද නගා කියවීමට සලස්වන්න.( පිල්ලමේ නාමය )

(1) නිවැරදි පිල්ලම සොයා යා කරන්න.

දික් ඉස්පිල්ල

කෙටි ඉස්පිල්ල



කෙටි ඇදපිල්ල

කෙටි කොන් පාපිල්ල ඇලපිල්ල

(2) පහත පිල්ලම්වලට අදාළ ශබ්දය හඳුනාගෙන යා කරන්න.

ඉස්පිල්ල

කෙටි ඇදපිල්ල

කොම්බුව

සි

රූ

දේ

කෑ

නෙ

දික් ඇදපාපිල්ල

කොම්බුව සහිත හල්කිරීම

(3) වගුවේ දී ඇති අකුරුවලින් පටන් ගන්නා වචන දෙක බැගින් ලියන්න.

| ඉස්පිල්ල | කෙටි ඇදපිල්ල | දික් ඇද පිල්ල | ඇලපිල්ල |
|---|---|---|---|
| මි<br>..................... | කැ<br>.................. | සෑ<br>................... | හා<br>.................. |
| කි<br>..................... | පැ<br>..................<br>......................... | නෑ<br>..................<br>..................... | තා<br>..................<br>..................... |
| රි<br>..................... | ගැ<br>...................... | ළෑ<br><br>..................... | රා<br>..................... |
| වි<br>........................ | වැ<br>....................... | මෑ<br>..................... | සා<br>..................... |

| කොම්බුව | දික් ඉස්පිල්ල | කෙටි පාපිල්ල | දික් පාපිල්ල |
|---|---|---|---|
| නෙ..................... | සී<br>...................... | පු<br>...................... | සූ<br>...................... |
| කෙ..................... | දී<br>...................... | නු<br>...................... | දූ..................... |

(4) පහත පිල්ලමේ නාමයට අදාළ පිල්ලම ලියන්න.

ඉස්පිල්ල -

ඇලපිල්ල -

කෙටි ඇදපිල්ල -

දික් ඇදපිල්ල -

දික් ඉස්පිල්ල -

කෙටි වක් පාපිල්ල -

කෙටි ඇද පාපිල්ල -

දික් පාපිල්ල -

කොම්බුව -

කොම්බුව සහිත හල් කිරීම -

(5) පහත ශබ්දවලට අදාළ වචන තෝරා ලියන්න.

මහත කැටය සැය
රැල්ල වහල පාලම දැත
සාමය වැල පැල්ලම

| අ ශබ්දය | ආ ශබ්දය | ඇ ශබ්දය | ඈ ශබ්දය |
|---|---|---|---|
| | | | |
| | | | |

(7) දී ඇති වචන සුදුසු පරිදි අදාළ පිල්ලම් ශබ්දයට අනුව සුදුසු බැලුම් බෝලය තුළ ලියන්න.

මිටිය පුසා
බීම දිනය
කුරුලු මීවදය



(8). දී ඇති පිල්ලම් යොදමින් වචන ලියන්න.

| කොම්බුව | කොම්බුව සහිත හල් කිරීම | කොම්බුව ඇලපිල්ල සහිත හල් කිරීම |
|---|---|---|
| ගෙ - ………………… | වේ - ………………… | කෝ- ………………… |
| ම - ………………… | කේ - ………………… | නෝ- ………………… |
| ප- ………………… | බේ- ………………… | බෝ- ………………… |
| ස- ………………… | පේ- ………………… | තෝ- ………………… |

(9).මෙම පිල්ලම් සහිත අකුරු යොදා වචන සාදා ලියන්න.

බෙ කු බෙ
පො
පි
කො කේ පී

i) ………………………………
ii)………………………………
iii)………………………………
iv)………………………………
v)………………………………
vi) ………………………………
vii)………………………………
viii) ……………………………
ix)………………………………
x)………………………………

(10) නිවැරදි පිළිතුරු තෝරා යා කරන්න.

| **පිල්ලම** | **වචනය** |
|---|---|
| කොම්බුව සහිත හල් කිරීම | පීරිසිය |
| දික් ඉස්පිල්ල | මොර |
| කොම්බුව සහිත ඇලපිල්ල | පාලම |
| කෙටි ඇද පාපිල්ල | මිහිරි |
| ඇලපිල්ල | කෝටුව |
| කෙටි ඉස්පිල්ල | රුවල |

(11) පිල්ලම ඉදිරියෙන් ලියන්න.

I. ගයනුකිත්ත ....................................

II. ගැටය සහිත ඇලපිල්ල ....................................

III. ගැටය සහිත ඇලපිලි දෙක .....................................

IV. කොම්බු දෙක .....................................

(12) පහත වචන ශබ්ද නගා කියවා නියමිත කොටුව තුළ නැවත ලියන්න

(දෛවය, ගෘහය, තෘණ, කෞමදී, වෛද්‍යවරයා, කෲර, ගෞරවය, බෲනායි)

| "**ඍ**" ශබ්දය | "**ඎ**" ශබ්දය | "**ඓ**" ශබ්දය | "**ඖ**" ශබ්දය |
|---|---|---|---|
| i)..................... | i).................. | i).................. | i) ............... |
| ii) .................. | ii) ............... | ii) ............... | ii) ............... |

(13) පිල්ලමට අදාළ වචනය ඉහතින් තෝරා අදාළ ස්ථානයේ ලියන්න.

ගෘහය තෘණ කෞමදී

කෲර වෘක්ෂ මෘදු

ගෞරවය බෲනායි

i). කොම්බුව හා ගයනුකිත්ත ……………………… ………………………

ii).ගැටය සහිත ඇලපිල්ල ……………………… ………………………

iii).ගැටය සහිත ඇලපිලි දෙක ……………………… ………………………

(14) දී ඇති වචනවල ඉරි ඇඳි අකුරට අදාළ පිල්ලමේ නම ලියන්න.

i) <u>වෘ</u>ත්තය - ………………………

ii) <u>නෞ</u>කාව - ………………………

iii) <u>කෲ</u>සෝ - ………………………

# අක්ෂර වින්‍යාසය

<u>**ක්‍රියාකාරකම**</u>

පහත දී ඇති අකුරු කාඩ්බෝඩ් රවුම්වල පැහැදිලිව ලියන්න.ඒවා තරමක් විශාල පෙට්ටියකටදමන්න.

- තවත් පෙට්ටි තුනක් සපයා ගන්න. ඒවා පහත ආකාරයට නම් කරන්න

උදා:- අකුරු




කුඩා පෙට්ටි තුන




- දරුවන් එළිමහනට කැඳවාගෙන ගොස් රවුමට සිටුවා මේ සියල්ල මැදින් තබන්න.
- අකුරු සියල්ල දමා ඇති පෙට්ටිය ළඟට දිව ගොස් ඉන් එකක් ගෙන එය දැමිය යුතු නම් කරන ලද කුඩා පෙට්ටි තුනෙන් එකකට දැමීමට යොමු කරන්න.
- දැන් ශබ්ද නගා කියවීමට යොමු කරන්න

(15) පහත වචන ශබ්ද නගා කියවන්න. බලා ලියන්න.

මුඛය - ............................................. ඡායාව - ..............................................

ඛනිජ - ............................................. පාඨය - ..............................................

ඡේදය - ............................................. රථය - ..............................................

ධූපය - ............................................. ප්‍රතිඵල - ..............................................

සඵල - ............................................. ධනය - ..............................................

(16) පහත වචන බලා ලියන්න.එම වචනවල ඇති මහාප්‍රාණ අකුර කුමක් දැයි ලියන්න

| වචනය | බලා ලිවීම | මහාප්‍රාණ අකුර |
|---|---|---|
| සංඝ | ............................... | ............................... |
| සජ්ඣායනාව | ............................... | ............................... |
| රූඪී | ............................... | ............................... |
| ප්‍රධාන | ............................... | ............................... |
| භාවනාව | ............................... | ............................... |

(17) පහත අකුරු යෙදෙන වචන දෙක බැගින් පෙළ පොතෙන් සොයා ලියන්න

| අක්ෂරය | පළමු වචනය | දෙවනි වචනය |
|---|---|---|
| ධ | ............................... | ............................... |
| ණ | ............................... | ............................... |
| ෂ | ............................... | ............................... |
| ළු | ............................... | ............................... |
| ළ | ............................... | ............................... |

(18) පහත වචනවල හිස්තැනට යෙදිය යුතු අකුර තෝරා යා කර ලියන්න.

උදා:- .....ධ...... ර්මය

විශේ.......... , පරි......රය , ප..........ල , ඵ..........වා , කාර..........ය

| ඵ | ධ | ද | ෂ | ස | න | ළ | ල | ණ |
|---|---|---|---|---|---|---|---|---|

(19) පහත වාක්‍ය කියවන්න. ඒවා හරි නම් (✓) ලකුණ ද වැරදි නම් (X) ලකුණ ද යොදන්න.

i. **ස** මහාප්‍රාණ අකුරකි (……)
ii. "**ෂ**" හඳුන්වන්නේ තාලුජ ලෙසය. (……)
iii. ධර්මය යන වචනය නිවැරදිය. (……)
iv. "**ප්‍රශ්න**" මෙහි 'න' මූර්ධජ විය යුතුය. (……)
v. නාම ලේ……නය වචනයේ හිස්තැනට "**ඛ**" ලියූ විට නිවැරදි ය. (……)

(20) මූර්ධජ **ෂ, ණ,ළ** වලින් වචන දෙක බැගින් ලියන්න. යෙදෙන වචන තුනක් ලියන්න

i) ..................................
ii) ..................................
iii) ..................................
iv) ..................................
v) ..................................
vi) ..................................

(21) නිවැරදි අකුර යොදා වචන සම්පූර්ණ කරන්න

i).භා ............ ව (ශා, ෂා)

ii).පරික්..........ණය ( ශ, ෂ)

iii).පෙ............ පොත ( ල,ළ)

iv).පෝෂ........... ය (න,ණ)

v).ත............කොළ ( න ,ණ)

vi)................පටි ( ල ,ළ)

(22) දී ඇති වචන කියවා අදාළ තීරුවෙහි ලියන්න.

( ප්‍රශංසාව, ලක්ෂණ, උෂ්ණ, ප්‍රදර්ශනය, ළිඳ, සංඛ්‍යාව, ධාර්මික)

| මූර්ධජ අකුරු යෙදෙන වචන | තාලුජ අකුරු යෙදෙන වචන | මහාප්‍රාණ අකුරු යෙදෙන වචන |
|---|---|---|
| i) | i) | i) |
| ii) | ii) | ii) |

(23) පහත අකුරු යෙදී ඇති වචන දෙක බැගින් මව්බස පෙළ පොත කියවා බලා සොයා ලියන්න

| ධ | භ | ෂ | ශ | ණ |
|---|---|---|---|---|
| i) | i) | i) | i) | i) |
| ii) | ii) | ii) | ii) | ii) |

(24) ඉහළ ගෙටත් බෙදාලා

පහළ ගෙටත් බෙදාලා

ළිඳේ තිබුණු ටිකිරි මුට්ටි

හතෙන් එකක් ගොඩ ගනියෝ

අතක් ගනින් හෙට්ටියෝ

i) ඉහත කවියේ මූර්ධජ අකුරක් යෙදුණු වචනයක් සොයා රවුම් කරන්න.

ii) එම වචනය හැර එහි ඇති මූර්ධජ අකුරු යෙදුණු වචනයක් සොයා ලියන්න

.................................................................................................................................

පහත ක්‍රියාකාරකම සඳහා සිසුන්ව යොමු කරන්න.





- මේ ආකාරයට සඤ්ඤක අක්ෂර යෙදුණු වචනයට ගැළපෙන පරිදි රූප කට්ටලය සාදා ගන්න.
- රූපයට පිටුපස පැත්තෙන් සඤ්ඤක අකුර පැහැදිලිව ලියන්න.

උදා :



ඹ

- වරකට එකක් ගන්න.
- "මම"අඹගෙඩියක්" - ඉදිරියට පැමිණ පවසන්න.
- "ඹ" - මේ සඤ්ඤක ඹ
- මේ ලෙසින් මාරුවෙන් සඤ්ඤක අකුර නිතර මතක් කරන්න.

(25) පහත අකුරු යොදා හිස්තැන් පුරවන්න

| ඹ | ඟ | ඳ | ඬ | ඦ |
|---|---|---|---|---|
| අ....... | ග....... | ක....... | හ....... | ඉ....... |
| ක ....... ය | ඇ......... ල්ල | හ ........... | අ ......... න | ......ංතක |
| කොහො ..... | අ ...... හරු | ඇ....... | හො ............ය | |

(26) පහත දී ඇති සඤ්ඤක අකුරු සහිත වචන යොදා සරල වාක්‍ය ගොඩනගන්න

උදා: කැඳ

- කැඳ - ගුණදායක පානයකි.

i)දඹල

..............................................................................................................................

ii)හොඬවැල

..............................................................................................................................

iii) ළිඳ

..............................................................................................................................

iv)කඹය

..............................................................................................................................

## නාම පද

**ක්‍රියාකාරකම**

- පහත නාම පදවල රූප කාඩ්පත් සහ වචන කාඩ්පත් සකසාගන්න.
  (පොත පැන්සල පුටුව බෝතලය තොප්පිය)
- එක් එක් රූප කාඩ්පත පෙන්වමින් එහි ඇත්තේ කුමක්දැයි සිසුන්ගෙන් විමසන්න.
- එම රූපවලට අදාළ වචන කාඩ්පත ද තේරීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- එම කාඩ්පත් ප්‍රදර්ශන පුවරුවක් මත රඳවන්න. නැතහොත් මේසය මත පෙළගස්වන්න.
- කියවූ එම පදවල යම් දෙයක්, ද්‍රව්‍යයක් ඇති බව පෙන්වා දෙමින් ද්‍රව්‍ය නාම පිළිබඳ ව තහවුරු කරන්න.
- සුදුසු ක්‍රියාකාරකමක් ඇසුරින් ම පුද්ගල නාම, ස්ථාන නාම හා සත්ත්ව නාම පිළිබඳව ද හඳුන්වා දෙන්න.

(27) පහත දී ඇති නාම පද, ද්‍රව්‍ය නාම හා ස්ථාන නාම ලෙස වෙන් කර දක්වන්න

පුවත්පත, මල් පෝච්චිය, පොලීසිය, කණ්ණාඩිය, කුඹුර, පන්සල, පල්ලිය, බේසම, කාමරය, මල

| ද්‍රව්‍ය නාම | ස්ථාන නාම |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |

(28) පහත දී ඇති නාම පද, සත්ත්ව නාම හා ස්ථාන නාම ලෙස වෙන් කර දක්වන්න

කූඹියා, තලගොයා, අක්කා, හෙදිය, තල්මසා, කොන්දොස්තර, කපුටා, දළඹුවා, නැන්දා, නායකයා

| ස්ථාන නාම | සත්ත්ව නාම |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |

(29) අදාළ නාම පදය තෝරා යා කරන්න

| | |
|---|---|
| **ද්‍රව්‍ය නාම** | කළුතර |
| **පුද්ගල නාම** | අත්තම්මා |
| **ස්ථාන නාම** | දුරකථනය |
| **සත්ත්ව නාම** | පණුවා |
| | වළල්ල |
| | මිදුල |
| | මුරකරු |
| | පැණි කුරුල්ලා |

(30) නාම පදයට අදාළ නිවැරදි කොටුව තෝරා හරි ලකුණක් යොදන්න

| නාම පදය | පුද්ගල නාම | ද්‍රව්‍ය නාම | සත්ත්ව නාම | ස්ථාන නාම |
|---|---|---|---|---|
| පිට්ටනිය | | | | |
| විදුහල්පතිතුමා | | | | |
| මුට්ටිය | | | | |
| සර්පයා | | | | |
| අල්මාරිය | | | | |

(31) පහත ඡේදයේ සඳහන් ද්‍රව්‍ය නාම **රතු පාටින්** ද, ස්ථාන නාම **නිල් පාටින්** ද ,පාට කරන්න

මම නිවසේ සැම තැන ම සොයා බැලුව ද මගේ නැති වූ සටහන් පොත හමුවූයේ නැත. සාලය, කාමරය මෙන් ම මුළුතැන්ගෙය පවා පරීක්ෂා කර බැලුවෙමි. අල්මාරි, රාක්ක, පුටු, මේස, මත පවා සටහන් පොත දක්නට නොවී ය. බෑගය ද නැවත අවුස්සා බැලුවෙමි. බෑගයේ පොත්, පෑන්, පැන්සල්, පාට පැන්සල් ආදී සියල්ල තිබුණ ද සටහන් පොත නම් නොවී ය.

(32) පහත ඡේදයේ සඳහන් පුද්ගල නාම කොළ පාටින් ද සත්ත්ව නාම කහ පාටින් ද පාට කරන්න

තාත්තා ප්‍රවේශ පත් කවුළුව වෙත ගොස් අම්මා, මල්ලී, අක්කා, සීයා සහ මා වෙනුවෙන් ප්‍රවේශ පත් මිලදී ගත්තේ ය. පසුව අපි සත්තු වත්තට ඇතුළු වීමු. පළමුව මින් මැදුරේ විවිධ මාළු වර්ග නැරඹීමු. සීල් මත්ස්‍යයින්ගේ නැටුම් බැලුවෙමු. චිම්පන්සි, ඔරංඔටං වැනි සතුන්ගේ සුරතල් හැසිරීම් ද, අලි ඇතුන්ගේ හැසිරීම් ද මමත්, මල්ලීත් ආසාවෙන් නැරඹීමු. වෙළෙඳුන්ගෙන් විවිධ රසවත් දේ අපට ගෙන දුන්නේ සරත් මාමා ය. සමනලුන්, කුරුල්ලන්, සර්පයන් අප දුටු තවත් සත්ත්ව විශේෂ ය.

(33) වරහන් තුළ දැක්වෙන නාම පද වර්ගයට අයත් නාම පදයක් යොදා පහත වාක්‍යවල හිස්තැන් සම්පූර්ණ කරන්න

උදා: <u>ආච්චි</u> (පුද්ගල නාම) පොහොය දිනයේ සිල් සමාදන් විය.

(i) මම ගස යටට ගොස් ..............................(ද්‍රව්‍ය නාම) අඹ කැඩුවෙමි.

(ii) ............................ (සත්ත්ව නාම) මලින් මලට යමින් මල් පැණි බොයි.

(iii) තාත්තා සැමදා දුම්රියෙන් ................................(ස්ථාන නාම) යයි.

(iv) ........................................ (පුද්ගල නාම) ක්‍රිකට් ක්‍රීඩා කරයි.

(34) ඔබ දන්නා නාම පද යොදා පහත වගුව සම්පූර්ණ කරන්න.

| පුද්ගල නාම | ද්‍රව්‍ය නාම | සත්ත්ව නාම | ස්ථාන නාම |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |

(35) පහත නාම පද යොදා වාක්‍ය නිර්මාණය කරන්න.

(i) බෝනික්කා

.............................................................................................................................

(ii) වඳුරෝ

.............................................................................................................................

(iii) යෙහෙළිය

.............................................................................................................................

(iv) සරුංගලය

.............................................................................................................................

(v) හෝටලය

.............................................................................................................................

# ඒක වචන හා බහු වචන නාම පද

(36) පහත දී ඇති රූප නම් කරන්න






........................... .......................... ........................... ..........................





.............................. .............................. ..............................

(37) ඉහත ලියූ නාම පද පහත දී ඇති වගුවේ නියමිත තීරුවේ නැවත ලියන්න

| ඒක වචන නාම පද | බහු වචන නාම පද |
|---|---|
| | |
| | |
| | |
| | |

(38) පහත දී ඇති නාම පදවල බහු වචන නාම පද ලියන්න

(i) වෙළෙන්දා - ..................................................

(ii) ගුරුවරයා - ..................................................

(iii) දොර - ..................................................

(iv) සපත්තුව - ..................................................

(v) කුඹුර - ..................................................

(39) ඉරි ඇඳි ඒක වචන නාම පදය වෙනුවට බහු වචන නාම පදය යොදා වාක්‍ය සම්පූර්ණ කරන්න

(i) **මේසය** උඩ පොත් ඇත. .......................... උඩ පොත් ඇත.

(ii) **කුරුල්ලා** කෑම සොයා පියඹා යයි. .......................... කෑම සොයා පියඹා යති.

(iii) **සරුංගලය** ඈත අහසේ පාවෙයි. .......................... ඈත අහසේ පාවෙයි

(iv) **ළමයා** මිදුල අතු ගා පිරිසිදු කරයි. .......................... මිදුල අතු ගා පිරිසිදු කරති.

(v) **අම්මා** අවුරුද්දට කෑම සාදයි. .......................... අවුරුද්දට කෑම සාදති.

# ප්‍රාණවාචී හා අප්‍රාණවාචී නාම පද

**ක්‍රියාකාරකම**

- පහත නාමපද කිහිපයක රූප කාඩ්පත් කිහිපයක් සකස් කරන්න.
  ( මල , කතුර , පූසා , නයා , පැන්සල , අම්මා )
- මෙම රූප ඉගෙනුම් ආධාරයක රඳවා ගන්න.
- රූපවල නම් සිසුන් සමග කිහිප වරක් කියවන්න.
- එහි ඇති සතුන්ගේ නම්, පුද්ගලයින්ගෙ නම්, හුනු පුවරුවේ ලියා ඒවාට පණ ඇති බව පෙන්වා දෙන්න.
- පුද්ගලයන් හා සතුන් සියලු දෙනාටම පණ ඇති නිසා ඒවා ප්‍රාණවාචී නාම පද ලෙසට හඳුන්වා දෙන්න .
- පසුව එහි ඇති ද්‍රව්‍යවල නම් හුනු පුවරුවේ ලියා ඒවාට පණ නැති බව පහදා දෙන්න.
- ද්‍රව්‍යවලට පණ නැති නිසා ඒවා අප්‍රාණවාචී නාම පද ලෙස හඳුන්වා දෙන්න.

(40) පහත නාම පද ප්‍රාණවාචී නාම පද හා අප්‍රාණවාචී නාම පද ලෙස වෙන් කර දක්වන්න.

( පොත,අයියා,මේසය, නංගී ,සීයා,අලියා,බයිසිකලය, ගුරුතුමිය, මයිනා, පුටුව)

| ප්‍රාණවාචී නාම පද | අප්‍රාණවාචී නාම පද |
|---|---|
| i)………………….......<br>ii)………………….......<br>iii)………………….......<br>iv)………………….......<br>v)…………………....... | i)………………….......<br>ii)………………….......<br>iii)………………….......<br>Iv)………………….......<br>v)…………………....... |

(41) පහත කවියේ ඇති ප්‍රාණවාචී නාම පද සොයා රවුම් කරන්න. අප්‍රාණවාචී නාම පද යටින් ඉරක් අඳින්න

අක්කයි නංගියි හනිකට
වෙරළු ගහ ළඟට දිව්වා
කුරුලු කූඩුවක් පැටවෙකු සමඟින්
බිම ඇති බව දුටුවා
කුරුලු අම්මා ගහ උඩ අත්තේ
කෑ ගසමින් සිටියා
මල්ලි ඇවිදින් කුරුලු කූඩුව
අත්තක් උඩ තැබුවා

(42) පහත ප්‍රාණවාචී හා අප්‍රාණවාචී නාම පද යොදා වාක්‍යය බැගින් නිර්මාණය කරන්න

i).කුරුලු පැටවා

.............................................................................................................................

ii).විදුහල්පතිතුමිය

.............................................................................................................................

iii). ගේට්ටුව

.............................................................................................................................

(43) පහත නාම පද ප්‍රාණවාචී නාම පද /අප්‍රාණවාචී නාම පද යන්නට නිවැරදිව යා කරන්න

| රාජාලියා | අප්‍රාණවාචී නාමපද |
|---|---|
| අල්මාරිය | |
| උදැල්ල | |
| නායකයා | ප්‍රාණවාචී නාම පද |
| මනුක | |
| පත්තෑයා | |
| කෝප්පය | |

(44) දී ඇති නාම පදය ,ප්‍රාණවාචී නාම පදයක් ද /අප්‍රාණවාචී නාම පදයක් ද යන්න තෝරා

ඊට ඉදිරියෙන් (√)ලකුණ යොදන්න

| නාම පදය | ප්‍රාණවාචී නාම පද | අප්‍රාණවාචී නාම පද |
|---|---|---|
| කුඩුව | | |
| මලිති | | |
| විදුහල්පතිතුමා | | |
| පුස්තකාලය | | |
| දළඹුවා | | |
| දරුවා | | |

## ස්ත්‍රී ලිංග හා පුරුෂ ලිංග නාම පද

**ක්‍රියාකාරකම**

- නාම පද කිහිපයක වචන කාඩ්පත් කිහිපයක් සකසා ගන්න.

| අම්මා | මිතුරා | අක්කා | කිරිල්ලි | තාත්තා | මිතුරිය |
|---|---|---|---|---|---|

- මෙම කාඩ්පත් සිසුන් කිහිප දෙනෙක් අතර බෙදන්න
- ගැහැනු අය හඟවන නාම පද කාඩ්පත් අතැති සිසුන් එක් ස්ථානයකටත් , පිරිමි අය හඟවන නාම පද ඇති සිසුන් තවත් ස්ථානයකටත් පැමිණ සිට ගැනීමට පවසන්න.
- තමා අතැති නාම පද පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න.
- එක් ස්ත්‍රී ලිංග නාම පදයක් පවසන විට ඊට ගැළපෙන පුරුෂ ලිංග නාම පදය ඇති සිසුවා එය අනෙක් සිසුවාට පැවසිය යුතු බව පහදා දෙන්න.

  උදා. අම්මා - තාත්තා

- පසුව හුනු පුවරුවේ මෙලෙස ලියා ස්ත්‍රී ලිංග නාම පද හා පුරුෂ ලිංග නාම පද හඳුන්වා දෙන්න.

(45) පහත නාම පද ස්ත්‍රී ලිංග හා පුරුෂ ලිංග ලෙස නාම පද ලෙස වෙන් කර ලියන්න

(පුතා, දුව, ගිරවා, ගිරවී ,ආච්චි, සියා, මුවා, මුවදෙන, කුරුල්ලා, කිරිල්ලී, රජ,රැජින)

| ස්ත්‍රී ලිංග නාම පද | පුරුෂ ලිංග නාම පද |
|---|---|
| i) ................................................ | i) ................................................ |
| ii) ................................................ | ii) ................................................ |
| iii) ................................................ | iii) ................................................ |
| iv) ................................................ | iv) ................................................ |
| v) ................................................ | v) ................................................ |
| vi) ................................................ | vi) ................................................ |

(46) පහත සඳහන් නම් කියවා එහි ඇති ස්ත්‍රී ලිංග හා පුරුෂ ලිංග නාම පද වගුවේ වෙන්කර දක්වන්න.

කුරුල්ලා අඹ අත්තට වී ඉන්නේ
කිරිල්ලී පැටවට කෑම කවන්නේ
මුවා ඇවිදිමින් දියට බහින්නේ
මුවදෙන පැටවට කිරි පොවමින්නේ

විදුහල්පති අපහට අමතන්නෙ
විදුහල්පතිනිය අවවාද කරන්නෙ
ගුරුතුමා අපහට අකුරු කරන්නෙ
ගුරුතුමී අපගේ තාල මවන්නෙ

| ස්ත්‍රී ලිංග නාමපද | පුරුෂ ලිංග නාම පද |
|---|---|
| i)............................................. | i)............................................. |
| ii)............................................. | ii)............................................. |
| iii)............................................. | iii)............................................. |
| iv)............................................. | iv)............................................. |

(47) නිවැරදි පිළිතුර තෝරා හිස්තැනෙහි ලියන්න

(සිංහයා, කිරිල්ලී, මිතුරා, කුරුල්ලා, සිංහ ධේනුව, මිතුරිය)

i) ...................................... කූඩුව සාදයි.

ii) ..................................... පැටවුන්ට කෑම කවයි.

iii) .................................... දඩයම් කරයි.

iv) ..................................... පැටවුන් සමඟ ගුහාවේ සිටියි.

v) ජනප්‍රිය ................................... වූයේ සමන් ය.

vi) ජනප්‍රිය .................................. වූයේ සඹීතා ය.

(48) කොටුව තුළ ඇති නාම පද ස්ත්‍රී ලිංග හා පුරුෂ ලිංග නාම පද ලෙස වෙන් කර දක්වන්න.

| | | | | | |
|---|---|---|---|---|---|
| කුරුල්ලා | නායිකාව | සිංහයා | | තාත්තා | |
| අම්මා | නායකයා | සිංහ ධේනුව | | | ගුරුතුමා |
| දුව | නංගි | කිරිල්ලී | මල්ලී | පුතා | ගුරුතුමිය |

| ස්ත්‍රී ලිංග නාම පද | පුරුෂ ලිංග නාම පද |
|---|---|
| i) .............................................. | i) .............................................. |
| ii) .............................................. | ii) .............................................. |
| iii) .............................................. | iii) .............................................. |
| iv) .............................................. | iv) .............................................. |
| v) .............................................. | v) .............................................. |
| vi) .............................................. | vi) .............................................. |
| vii) .............................................. | vii) .............................................. |

(49) වරහන් තුළින් තෝරා නිවැරදි නාම පදය යොදා වාක්‍ය සම්පූර්ණ කරන්න

(අම්මා, මේසය, සිරිමත්, පන්සල, ඇතා)

(i) දළ යුවලක් ඇති ............................................ විශාල සතෙකි.

(ii) .............................................. මල් පැළවලට සාත්තු කළා ය.

(iii) සිල් ඇත්තෝ පෝය දිනට ...................................................... වෙත යති.

(iv)................................................ මත පොත් රාශියක් තබා ඇත.

(v) ............................................ ඉතා යහපත් දරුවෙකි.

(50) පහත කවි කියවා බලා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න

මේ මල් වත්ත මැද
තිබෙන මල් මොනවාද
අර මී මැස්සෙක් ද
රුං රුං මී මැසි හඬ ද

පිපෙන සැන්දෑවේ
මල් හෙන්දිරික්කා, වේ
නංගි අර ආවේ
ඇයත් ලස්සන මලක් මෙන් වේ

i) පළමු කවියේ ඇති ස්ථාන නාම පදයක් තෝරා ලියන්න ..................................................

ii) පළමු කවියේ ඇති සත්ව නාම පදයක් තෝරා ලියන්න ..................................................

iii) දෙවැනි කවියේ ඇති ද්‍රව්‍ය නාම පදයක් තෝරා ලියන්න ..............................................

iv) දෙවැනි කවියේ ඇති පුද්ගල නාම පදයක් තෝරා ලියන්න ..............................................

## සමානාර්ථ පද

**ක්‍රියාකාරකම**

- පහත වචනවලට අදාළ රූප කාඩ්පත් සකසා ගන්න.
  ගස, ඉර, ඔළුව, තරු, ගෙදර
- සිසුන් එම රූප නම් කිරීමෙන් පසු එම රූප හඳුන්වන වෙනත් නම් දන්නේ දැයි විමසන්න.
- ඔවුන්ගේ පිළිතුරු අනුව ඒ ඒ රූපයට අදාළ ව පෙර ශ්‍රේණිවල දී උගත් සමානාර්ථ පද හඳුන්වා දෙන්න.
- යමක් හැඳින්වීමට භාවිත කරන විවිධ වචන තිබෙන බවත්, එක ම දෙයකට පද දෙකක් හෝ එයට වැඩි ගණනක් හෝ භාවිත කරන බවත්, එම පද "සමානාර්ථ පද" ලෙස හඳුන්වන බවත් අවබෝධය තහවුරු කරන්න.
- 1 සහ 2 ශ්‍රේණිවල උගත් සමානාර්ථ පද පළමුව හඳුන්වා දෙන්න.

| | |
|---|---|
| ගස = රුක | අහස = ගුවන |
| තාත්තා = පියා | ඉර = හිරු |
| පාසල = විදුහල | ප්‍රවෘත්තිය = පුවත |
| තරු = තාරකා | රාත්‍රිය = රැය |
| දූපත = දිවයින | ඔළුව = හිස |

(51) නිවැරදි සමානාර්ථ පදය තෝරා යා කරන්න.

| | |
|---|---|
| පාසල | තාරකා |
| ගස | දිවයින |
| තරු | විදුහල |
| දූපත | පියා |
| තාත්තා | රුක |

(52) දී ඇති පදයට ගැළපෙන නිවැරදි සමානාර්ථ පදය වරහන් තුළින් තෝරා යටින් ඉරක් අඳින්න

(i) අහස (පොළොව, වත්ත, ගුවන, පිට්ටනිය)

(ii) ඉර (හිරු, සඳ, තරුව, වලාකුළු)

(iii) ඔළුව (අත, කකුල, හිස, උදරය)

(iv) ප්‍රවෘත්තිය (නැටුම, පුවත, සින්දුව, කතාව)

(v) රාත්‍රිය (උදෑසන, දහවල, සවස, රැය)

(53) ගැළපෙන සමානාර්ථ පද වරහන් තුළින් තෝරා හිස්තැනෙහි ලියන්න

(ඔළුව, රාත්‍රිය, විදුහල, දිවයින, හිරු)

(i) අපේ .......................... (පාසල) සුන්දර කඳු ගැටයක පිහිටා ඇත.

(ii)උදෑසන ම නැග එන .......................... (ඉර) පරිසරය ආලෝකමත් කරයි.

(iii) අපේ රට මුහුදින් වට වූ .......................... (දූපත) කි.

(iv)වේගයෙන් දිව ගිය මගේ .......................... (හිස) බිත්තියේ හැපුණි.

(v) .......................... (රැය) උදාවන තුරු මම නොඉවසිල්ලෙන් බලා සිටියෙමි.

(54) ඉරි ඇඳි පදයට ගැළපෙන සමානාර්ථ පදය යොදා වාක්‍ය නැවත ලියන්න

(i) අහස පුරා කුරුල්ලෝ පියාසර කරති.

.................................................................................................................................................

(ii) උදෑසන ම කඳු මුදුනින් ඉර පායා එයි.

.................................................................................................................................................

(iii) අක්කා ආදරයෙන් නංගිගේ ඔළුව අත ගෑවා ය.

.................................................................................................................................................

(iv) නායකයාගේ මරණය පිළිබඳ පුවෘත්තිය නිසා මහජනයා කලබල විය.

.................................................................................................................................................

(v) රාත්‍රිය උදාවත් ම සඳ නැග එන්නට විය.

.................................................................................................................................................

මුල් ක්‍රියාකාරකම ලෙස ම 3, 4 ශ්‍රේණිවලට අයත් සමානාර්ථ පද ද හඳුන්වා දෙන්න.

| | |
|---|---|
| අම්මා = මව | උදෑසන = හිමිදිරිය |
| ගෙදර = නිවස | කුරුල්ලා = පක්ෂියා |
| පාර = මාර්ගය | පාදය = කකුල |
| කැලෑව = වනය | වතුර = ජලය |
| ඇස් = නෙත් | පොත = ග්‍රන්ථය |

(55) දී ඇති පදයට ගැළපෙන සමානාර්ථ පදය කොටුවෙන් තෝරා ලියන්න.

| | | | | |
|---|---|---|---|---|
| මාර්ගය | මව | වනය | නෙත් | නිවස |

(i) පාර = ..............................

(ii) අම්මා = ..............................

(iii) ගෙදර = ..............................

(iv) ඇස් = ..............................

(v) කැලෑව = ..............................

(56) මැද රවුම තුළ ඇති පදවලට ගැළපෙන සමානාර්ථ පදය පිටත වචනවලින් තෝරා යා කරන්න

පක්ෂියා ග්‍රන්ථය

උදෑසන

හිමිදිරිය

කුරුල්ලා

පාදය

පොත වතුර

ජලය

කකුල

(57) දී ඇති පදයට ගැළපෙන සමානාර්ථ පදය යොදා වාක්‍යය බැගින් නිර්මාණය කරන්න

i) අම්මා -

..........................................................................................................................

ii) ගෙදර -

..........................................................................................................................

iii) පාර -

..........................................................................................................................

iv) කැලෑව -

..........................................................................................................................

v) ඇස් -

..........................................................................................................................

(58) ඉරි ඇඳි පදයට ගැළපෙන සමානාර්ථ පදය යොදා වාක්‍ය නැවත ලියන්න

i) උදෑසන දිනයක සුන්දර ම කාලය යි.

......................................................................................................................

ii) කුරුල්ලා පැටවුන් වෙනුවෙන් කෑම සොයා ඉගිල ගියේ ය.

......................................................................................................................

iii) සුබ නැකතින් දකුණු කකුළ පෙරට තබා ගමන ඇරඹීය.

......................................................................................................................

iv) දිනපතා ප්‍රමාණවත් තරම් ජලය පානය කළ යුතු ය.

......................................................................................................................

v) මාර්ටින් වික්‍රමසිංහගේ මඩොල් දූව පොත මගේ සිත් ගත් පොතකි.

......................................................................................................................

## විරුද්ධාර්ථ පද

**ක්‍රියාකාරකම**

- පහත විරුද්ධාර්ථ පදවලට අදාළ රූප කාඩ්පත් කිහිපයක් සකසා ගන්න.

  උස - මිටි
  පිපෙනවා - පරවෙනවා
  ලොකු - පොඩි
  පිරිසිදු - අපිරිසිදු
  මහතයි - කෙට්ටුයි

- උස, ලොකු, මහතයි, පිපෙනවා, පිරිසිදු යන රූප කාඩ්පත් එක් පෙට්ටියකටත් ඒවාට අදාළ විරුද්ධාර්ථ පදය සහිත අනෙක් කාඩ්පත් තවත් පෙට්ටියකටත් දමන්න.
- පළමු පෙට්ටියෙන් කැමති කාඩ්පතක් තෝරා ගැනීමට සිසුවාට අවස්ථාව දෙන්න එහි ඇති දේ පිළිබඳ ව විමසන්න. (අදාළ පදය ම පිළිතුරු ලෙස ලබා ගැනීමට මග පෙන්වීම් කරන්න.)
- ඒ අනුව එම පදයට සම්පූර්ණයෙන් ම වෙනස් අදහසක් සහිත රූප කාඩ්පත් අනෙක් පෙට්ටියේ ඇති බවත්, එය තෝරා ගන්නා ලෙසත් සිසුවාට උපදෙස් දෙන්න.
- මේ ආකාරයට විරුද්ධාර්ථ පහ ම ගොඩනගන්න.
- සාධන මට්ටම අනුව 1 සහ 2 සහ 3, 4 ශ්‍රේණිවල උගත් විරුද්ධාර්ථ පද කිහිප වරක දී හෝ එකවර සිසුවාට හඳුන්වා දෙන්න.

| | | | |
|---|---|---|---|
| උඩ - යට | ලොකු - පොඩි | මහතයි - කෙට්ටුයි | යහපත් - අයහපත් |
| උස - මිටි | කැමති - අකමැති | යනවා - එනවා | ආරම්භය - අවසානය |
| ඉදිරිපස - පිටුපස | පිපෙනවා - පරවෙනවා | පිරිසිදු - අපිරිසිදු | දිරන - නොදිරන |
| ඉහළ - පහළ | කීකරු යි - අකීකරු යි | ප්‍රශ්න - පිළිතුරු | සුදුසු - නොසුදුසු |
| ගැළපෙන - නොගැළපෙන | සෙමෙන් - වේගයෙන් | පුරුදු - නුපුරුදු | ලස්සන - අවලස්සන |

(59) නිවැරදි විරුද්ධාර්ථ පදය ඇතුළත් කොටුව තෝරා යා කරන්න

| ලොකු | කීකරුයි | ගැළපෙන |
|---|---|---|

| පොඩි | විශාල |
|---|---|

| නපුරුයි | අකීකරු යි |
|---|---|

| නොගැළපෙන | නුසුදුසුයි |
|---|---|

| සෙමෙන් | ඉදිරිපස |
|---|---|

| වේගයෙන් | කලබල |
|---|---|

| පිටුපස | මැද |
|---|---|

(60) ගැළපෙන විරුද්ධාර්ථ පද යුගලය වරහනින් තෝරා හිස්තැන් මත ලියන්න

(උඩ - යට / උස - මිටි /ඉහළට - පහළට / කැමති - අකමැති / පිපෙනවා - පරවෙනවා)

i) උදෑසන මල් ....................... සවසට .......................

ii) රසවත් ආහාරවලට කවුරුත්.......................ය. නීරස ආහාරවලට ..............................

iii) පූසා වහලය ........................... නිදා සිටියි. බල්ලා මේසය.......................නිදා සිටියි.

iv)ජිරාෆ් පොළොවේ ජීවත් වන ....................... අශ්වයා ඌට වඩා .................. ය.

(v)අක්කා පඩි පෙළ නැග .................. යද්දී අයියා පඩිපෙළ ............................. බැස්සේ ය.

(61) හිස්තැනට ගැළපෙන විරුද්ධාර්ථ පදය යොදන්න

ඉහළ -............................

කැමති - ............................

............................ - අකීකරු යි

ගැළපෙන - ............................

............................ - වේගයෙන්

(62) පහත වාක්‍යවල වරහන් තුළ දක්වා ඇති පදයට ගැළපෙන විරුද්ධාර්ථ පදය හිස්තැන මත ලියන්න.

i) මම ගොඩනැගිල්ලේ ............................. (යට) සිට පහත බැලුවෙමි.

ii) නංගී ................................ (මිටි) ස්ථානවලට බියක් දක්වයි.

iii) නිමන්ත පෝළිමේ ................................ (පිටුපස) සිට ගත්තේ ය.

iv) අම්මා පොල් ගොඩෙන්................................ (පොඩි) ගෙඩියක් තෝරා ගත්තා ය.

v) සේපාලිකා මල් සුවඳ දෙමින් රාත්‍රියේ ................................ (පරවෙනවා.)

(63) පහත පද අතරින් විරුද්ධාර්ථ පද යුගල් තෝරා කොටුකර ඔබ කැමති පාටකින් පාට කරන්න

| | | | | | |
|---|---|---|---|---|---|
| පාන්දර | මහතයි | සවස | පුරුදු | පිරිසිදු | උණුසුම |
| සුවඳ | අපිරිසිදු | පඳුර | යනවා | පරදිනවා | |
| | | පාර්සලය | | | |
| එනවා | ප්‍රශ්න | දුවනවා | කෙට්ටුයි | | |
| | පිළිතුරු | නුපුරුදු | | | |

(64) ගැළපෙන විරුද්ධාර්ථ පද තෝරා යා කරන්න

| | |
|---|---|
| යහපත් | නොදිරන |
| ආරම්භය | අයහපත් |
| දිරන | අවලස්සන |
| සුදුසු | අවසානය |
| ලස්සන | නුසුදුසු |

(65) ඉරි ඇඳි පදයට ගැළපෙන විරුද්ධාර්ථ පදය සමඟ වාක්‍ය නැවත ලියන්න.

i) අද උදෑසන සිට ම යහපත් කාලගුණයක් පැවතිණි.

.............................................................................................................................

ii) ගමනේ ආරම්භය සතුටින් සිදුවිය.

.............................................................................................................................

iii) දිරන අපද්‍රව්‍ය මෙම බඳුනට දමන්න

.............................................................................................................................

iv) දියවැඩියා රෝගය සඳහා එම ආහාර සුදුසු ය.

.............................................................................................................................

v) උදෑසන ම දුටු ලස්සන දර්ශනය පුදුම සහගත විය.

.............................................................................................................................

(66) දී ඇති පදයට ගැළපෙන විරුද්ධාර්ථ පදය යොදා වාක්‍යයක් ගොඩනගන්න

i) නොදිරන

.............................................................................................................................

ii) අවලස්සන

.............................................................................................................................

iii) අයහපත්

.............................................................................................................................

iv) නුසුදුසු

.............................................................................................................................

v) අවසානය

.............................................................................................................................

## යුගල පද

ක්‍රියාකාරකම

- පහත යුගල පද කාඩ්පත්වල ලියා සකසා ගන්න.

| | | | | |
|---|---|---|---|---|
| ගමන් බිමන් | අහල පහල | සිරිත් විරිත් | තෑගි බෝග | කෑම බීම |

- ඒවා සිසුන්ට කියවීමට අවස්ථාව දෙන්න.
- ගුරුතුමිය විසින් වාක්‍ය ගොඩනගමින් යුගල පද හඳුන්වා දෙන්න.
- සිසුන්ට ද හැකි පරිදි වාක්‍ය ගොඩ නගා පැවසීමට අවස්ථාව දෙන්න.
- 4 ශ්‍රේණියට නියමිත යුගල පද ද හඳුන්වා දෙන්න.

| | | | | |
|---|---|---|---|---|
| ගෙවල් දොරවල් | යාන වාහන | වතු පිටි | කෙළි සෙල්ලම් | පොත් පත් |

(67) පහත යුගල පදවල අඩු පදය සම්පූර්ණ කරන්න

i) ....................... විරිත්

ii) තෑගි .......................

iii) කෑම.......................

iv) ....................... පහල

v) ....................... බිමන්

(68) පහත වාක්‍යවලට ගැළපෙන යුගල පද වරහන් තුළින් තෝරා ලියන්න

(ගෙවල් දොරවල්, යාන වාහන, වතු පිටි, කෙළි සෙල්ලම්, පොත් පත්)

i) දවස ම .............................................. කරනවා හැර පාඩම් වැඩ නොකරන නිසා අම්මා මල්ලීට බැන වැදුණා ය.

ii) ගංවතුර පිළිබඳ අනතුරු ඇඟවීම එම ගමේ මිනිස්සු .......................................... හැරදා වෙනත් ගමකට ගියහ.

iii) මුදලාලි ඔහුගේ ........................................... වල පොල් කැඩීමට මිනිසෙකු සෙවී ය.

iv) පාරේ .............................................. තදබදය නිසා ගමන ප්‍රමාද විය.

v) මම අලුත් .............................................. කවර දමා අලුත් පන්තියට ගෙන ගියෙමි.

(69) ගැළපෙන යුගල පද තෝරා යා කරන්න.

| | |
|---|---|
| යාන | සෙල්ලම් |
| ගෙවල් | වාහන |
| කෙළි | පත් |
| පොත් | පිටි |
| වතු | දොරවල් |

(70). පහත යුගල පද යොදා වාක්‍යය බැගින් නිර්මාණය කරන්න.

i) ගමන් බිමන්

.....................................................................................................................

ii) තෑගි බෝග

.....................................................................................................................

iii) අහල පහල

.....................................................................................................................

iv) කෑම බීම

.....................................................................................................................

v) සිරිත් විරිත්

.....................................................................................................................

## වර්තමාන කාල ක්‍රියා පද

- (වර්තමාන කාල ක්‍රියා පද හඳුන්වා දීම සඳහා ක්‍රියා පද ලියූ කාඩ්පත් (ඒක වචන / බහු වචන ) කිහිපයක් යොදා ගනිමින් සුදුසු ක්‍රියාකාරකමක යොදවන්න.)

(71) පහත සඳහන් වැකි ලිඛිත බසට හරවා නැවත ලියන්න

1. මම මල් කඩනවා.

..........................................................................................................................................

2. මම ගෙදර යනවා.

..........................................................................................................................................

3. මම බත් කනවා.

..........................................................................................................................................

4. අපි පාසල් යනවා.

..........................................................................................................................................

5. අපි සෙල්ලම් කරනවා.

..........................................................................................................................................

6. අපි අකුරු ලියනවා.

..........................................................................................................................................

7. මද සුළඟට කොළ පාවෙනවා.

..........................................................................................................................................

8. ඇය දර කඩනවා.

..........................................................................................................................................

9. ළමයා පොත් පාඩම් කරනවා.

..........................................................................................................................................

10. නැන්දා පොළට යනවා.

..........................................................................................................................................

11. මාමා අපට තෑගි දෙනවා.

..........................................................................................................................................

12. දරුවා වේගයෙන් දුවනවා.

.......................................................................................................................................................

13. කාන්තාවෝ වෙහෙස වී වැඩ කරනවා.

.......................................................................................................................................................

14.ගායිකාවෝ ගීත ගායනා කරනවා.

.......................................................................................................................................................

15. ඔවුහු වේගයෙන් දුවනවා.

.......................................................................................................................................................

(72) සුදුසු වර්තමාන කාල ක්‍රියා පද යොදා වැකි සම්පූර්ණ කරන්න

i). මම ගමට ……………... (යමි /යමු)

ii). මම අකුරු ……………... (ලියමු/ලියමි)

iii). අපි බුදුන් ……………... (වදිමු/වදිමි)

iv). අපි පාඩම් ……………... (කරමි/කරමු)

v). අපි කඩයට ……………... (යමි/යමු)

(73) වර්තමාන කාල ක්‍රියා පද යොදා වැකි සම්පූර්ණ කරන්න

i).ළමයා කතන්දරයක් ……………... (කියයි /කියමු)

ii). අක්කා දියට ……………... (යති/යයි)

iii).අම්මා නංගී…………….. (නළවයි/නළවති)

iv). දුව කඩයට…………….. (යති/යයි)

v). ගොවියා කුඹුර…………….. (කොටයි/කොටති)

vi). බල්ලා වේගයෙන්…………….. (දුවයි/දුවති)

vii). පූසා කිරි…………….. (බොයි/බොති)

viii). මල් පරවී බිම…………….. (වැටෙයි/වැටෙති)

(74) වර්තමාන කාල බහු වචන ක්‍රියාපද යොදා වැකි සම්පූර්ණ කරන්න

i) රජ්ජුරුවෝ රට පාලනය……………..(කරයි /කරති)

ii) තාත්තලා කුඹුරට…………….. (යයි/යති)

iii) නංගිලා මල්…………….. (කඩති/කඩයි)

iv) මුවෝ දිය බීමට…………….. (එයි/එති)

v) තාරකා අහසේ…………….. (බබළයි/බබළති)

vi) ගංගා ගලා……………..(බසියි/බසිති)

(75) සුදුසු ක්‍රියාපදය තෝරා යා කරන්න.

| | |
|---|---|
| අපි නගරයට | යමි |
| මම පන්සල් | ලියති |
| අක්කලා අකුරු | යමු |
| නංගී පොත් | යයි |
| තාත්තා වැඩ | යති |
| කුරුල්ලො අහසේ | පිපෙයි |
| මල් උදෑසන | කියවයි |

(74) වර්තමාන කාල ක්‍රියාපද යොදා හිස්තැන් සම්පූර්ණ කරන්න.

i) මල්ලි චිත්‍රයක් ................................................

ii) අක්කා නංගි ...................................................

iii) මම හොඳින් පාඩම් .........................................

iv) ගුරුතුමිය කතන්දරයක් ....................................

v) ගොවියෝ උදෑසනම කුඹුරටම ............................

vi) ළමයි හොඳින් ඉගෙන .......................................

vii) සැඩ සුළඟ .......................................................

viii) අපි බයිසිකල් ..................................................

ix) අපි ශ්‍රමදානයට .................................................

(75) වර්තමාන කාල ක්‍රියා පදය යටින් ඉරක් අදින්න.

i). ළමයා කතන්දරයක්……………..(කියයි /කියමු)

ii). අක්කා දියට…………….. (යති/යයි)

iii).අම්මා නංගී…………….. (නළවයි/නළවති)

iv).දුව කඩයට…………….. (යති/යයි)

v).ගොවියා කුඹුර…………….. (කොටයි/කොටති)

vi).බල්ලා වේගයෙන්…………….. (දුවයි/දුවති)

vii).පූසා  කිරි…………….. (බොයි/බොති)

viii).මල් පරවී බිම…………….. (වැටෙයි /වැටෙති)

(76) සුදුසු වර්තමාන කාලය  ක්‍රියා පද යොදා වැකි සම්පූර්ණ කරන්න

i). මම ගමට …………….. (යමි /යමු)

ii). මම අකුරු ……………..(ලියමු/ලියමි)

iii). අපි බුදුන් ……………..(වදිමු/වදිමි)

iv). අපි පාඩම් …………….. (කරමි/කරමු)

v). අපි කඩයට ……………..(යමි/යමු)

(77) වර්තමාන කාල බහුවචන ක්‍රියාපද යොදා වැකි සම්පූර්ණ කරන්න.

i). රජ්ජුරුවෝ රට පාලනය……………..( කරයි/කරති)

ii). තාත්තලා කුඹුරට…………….. (යයි/යති)

iii). නංගිලා මල්…………….. (කඩති/කඩයි)

iv). මුවෝ දිය බීමට…………….. (එයි/එති)

v). තාරකා අහසේ…………….. (බබළයි/බබළති)

vi). ගංගා ගලා……………..( බසියි/බසිති)

(78) සුදුසු ක්‍රියාපදය තෝරා යා කරන්න

| | |
|---|---|
| i). අපි නගරයට | යමි |
| ii). මම පන්සල් | ලියති |
| iii). අක්කලා අකුරු | යමු |
| iv). නංගී පොත් | යයි |
| v). තාත්තා වැඩ | කියවයි |
| vi). කුරුල්ලෝ අහසේ පියාසර | පිපෙයි |
| vii). මල් උදෑසන | කරති |

(79) වර්තමාන කාල ක්‍රියාපද යොදා හිස්තැන් සම්පූර්ණ කරන්න

i). මල්ලි චිත්‍රයක්……………..

ii). අක්කා නංගි……………..

iii). මම හොඳින් පාඩම්……………..

iv). ගුරුතුමිය කතන්දරයක් ……………..

v). ගොවියෝ උදෑසනම කුඹුරට ම……………..

vi). ළමයි හොඳින් ඉගෙන……………..

vii). සැඩ සුළඟ……………..

viii). අපි බයිසිකල්……………..

## අතීත කාල ක්‍රියාපද

(80) අතීත කාල ක්‍රියාපද හඳුන්වා දීම සඳහා ක්‍රියාපද කාඩ්පත් කිහිපයක් සපයාගෙන නිර්මාණාත්මක ක්‍රියාකරකමක් කරන්න

1) පහත වැකි අතීත කාල ක්‍රියාපද යොදා ලිඛිත බසට හරවා ලියන්න.

i). මම ගෙදර ගියා.

.....................................................................................................

ii). මම මල් කැඩුවා.

.....................................................................................................

iii). මම අකුරු ලිව්වා.

.....................................................................................................

iv). අපි සෙල්ලම් කරනවා.

.....................................................................................................

v). අපි ගසට නැග්ගා.

.....................................................................................................

vi). මල්ලි පාසල් ගියා.

.....................................................................................................

vii). අයියා පොත ලිව්වා.

.....................................................................................................

viii). වෙළෙන්දා පොළට ගියා.

.....................................................................................................

ix). සිංහයා වේගයෙන් දිව්වා.

.....................................................................................................

x). ගිරවා පලතුරු කෑවා.

.....................................................................................................

xi). ඔහු දර පැලුවා.

.....................................................................................................

xii). ඔහු චිත්‍රයක් ඇන්දා.

.......................................................................................................

xiii). අක්කා නංගී නැළෙව්වා.

.......................................................................................................

xiv). වෙළෙන්දා බඩු විකුණුවා.

.......................................................................................................

xv). නංගීලා ක්‍රීඩා කළා.

.......................................................................................................

xvi). ගෙවිලියෝ ඇඹුල ගෙනාවා.

.......................................................................................................

xvii). කිරිල්ලියක පැටවුන්ට කෑම දුන්නා.

.......................................................................................................

xviii). අම්මා නිවසට ගියා.

.......................................................................................................

(81) සුදුසු අතීත ක්‍රියා පදය වරහන් තුළින් තෝරා යටින් ඉරක් අඳින්න.

i). මම මල් ....................................(කඩමි /කැඩුවෙමි)

ii). අපි බඩු මිලදී.....................................(ගනිමි/ගත්තෙමු)

iii). මම උදයේම අවදි....................................(වුණෙමි/වුණෙමු)

iv). අපි අසල්වැසියන්ට ආහාර ....................................(දුන්නෙමි/දුන්නෙමු)

v). මම හොඳින් පාඩම්.................................... (කළෙමි/කළෙමු)

vi). අපි උදෑසනම නගරයට.................................... (ගියෙමි/ගියෙමු)

vii). නැන්දා ලියුමක්....................................( ලිව්වා ය/ලිව්වේ ය)

viii). පියුමි උදයේම....................................( නැගිට්ටා ය/නැගිට්ටෙමු)

ix). ඇය ගීතයක්....................................(ගැයුවෙමි/ගැයුවා ය)

x). ගුරුතුමිය අකුරු....................................( ලිව්වා ය/ලිව්වේ ය)

xi). වෙළෙන්දිය බඩු මිලදී .................................... ( ගත්තා ය/ගත්තේ ය)

xii). අම්මා මිදුල .................................... (අතුගෑවේ ය/අතුගෑවා ය)

xiii). කුරුල්ලා මිහිරි ගී ගායනා ....................................(කළා ය/කළේ ය)

xiv). වෛද්‍යවරයා රෝගීන්ට ප්‍රතිකාර .................................... (කළා ය/කළේ ය)

xv). ගුරුවරයා උපදෙස් ....................................( දුන්නා ය/ දුන්නේ ය)

xvi). රජ්ජුරුවෝ රට පාලනය .................................... (කළා ය /කළේ ය)

xvii). පූසා මීයා .................................... (ඇල්ලුවේ ය/ඇල්ලූවා ය)

xviii). පියා දරුවන් රැක .................................... (ගත්තේ ය/ගත්තා ය)

xix). ඔහු දියඹට .................................... (ගියා ය/ ගියේ ය)

xx). ඔවුහු වැඩ ....................................(කළා ය/කළෝ ය)

(82) අතීත කාල බහු වචන ක්‍රියා පද යොදා වැකි සම්පූර්ණ කරන්න.

i).ලිපිකරුවෝ සේවයට............................. (පැමිණියා ය/ පැමිණියෝ ය)

ii).ගුරුවරු ඔවදන්.............................(දෙති/දුන්නෝ ය)

iii).තාත්තලා ගමට............................. ( ගියෝ ය/ යයි)

iv).ඇත්තු පෙරහැරේ ගමන්.............................( කරති/කළෝ ය.)

v). වැහි ළිහිණියෝ වැස්සක පෙර නිමිති.............................( කියති/කිව්වෝ ය)

vi). මී මැස්සෝ රොන්............................. (ගනිති/ගත්තෝ ය)

vii). ඔවුහු මිදුලේ .............................( ඇවිද්දේ ය / ඇවිදිති)

viii). නළුවෝ වේදිකාවට .............................(පැමිණෙයි / පැමිණෙති)

(83) යා කරන්න

| | | |
|---|---|---|
| i) . | ලේනා අඹ | ඇල්ලුවේ ය. |
| ii). | පොලීසිය සොරු | යේය ය. |
| iii). | ඇය අකුරු | කෑවේ ය. |
| iv). | ඔහු ළිඳට | ලිව්වා ය. |
| v). | මනමේ කුමාරයා වේදිකාවට | පැමිණියෝ ය. |
| vi). | වෛද්‍යවරුන් රෝගීන්ට ප්‍රතිකාර | කළෝ ය. |
| vii). | ඔවුහු දිනපතා පාසල් | ආවේ ය. |
| viii). | ඊයේ නංගී පන්සල් | පැලුවේ ය. |
| ix). | තාත්තා දර | කළා ය. |
| x). | අක්කා ගෙදර වැඩ | ගියා ය. |

(84) පහත දී ඇති අප්‍රාණවාචී වර්තමාන කාල වාක්‍ය අතීත කාල බහු වචනයට හරවා නැවත ලියන්න.

i). දිය ඇල්ල පහළට ගලා බසියි.

.............................................................................................................

ii). මල සවසට පරවී බිම වැටෙයි.

.............................................................................................................

iii). ගුවන් යානය අහසේ පියාසර කරයි.

.............................................................................................................

iv). සේපාලිකා මල හවසට පිපෙයි.

.............................................................................................................

v). තරුව අහසේ බබළයි.

.............................................................................................................

(85) පහත සඳහන් වැකි හරි නම් (√)ලකුණ ද වැරදි නම් (×) ලකුණ ද ඉදිරියෙන් ඇති වරහන තුළ යොදන්න

i). සීයා අපට කතාවක් කියා දුන්නේ ය. ( )

ii).ඇය ලස්සන නැටුමක් නැටුවා ය. ( )

iii). නංගී මල් වට්ටියක් කැඩුවා ය. ( )

iv). ගස් සුළගට ඒ මේ අත වැනෙති. ( )

v). දිය ඇලි පරිසරයේ සුන්දරත්වය වැඩි කරයි. ( )

vi). දක්ෂ ශිෂ්‍යයෝ පොත් පාඩම් කරයි. ( )

vii). විද්‍යාඥයෝ සඳ පිළිබඳ සොයා බැලුවේ ය. ( )

viii). චන්ද්‍රිකාව සඳ තරණය කළේ ය. ( )

viii). කමල් හොඳින් ඉගෙන ගනිති. ( )

(86) හිස්තැන් සම්පූර්ණ කරන්න

i) …………............. (මම/අපි) සතුන් රැක බලා ගනිමු.

ii) …………............. (මුවා/මුවෝ) විලට බැස වතුර බිව්වෝ ය.

iii) …………............. (ළමයා/ළමයි) අකුරු උගනිති.

iv) …………............. (නංගී/මල්ලි) විභාගයෙන් සමත් වූවා ය.

v) …………............. ( මව/ පියා) අපිව ආදරයෙන් රැක බලා ගත්තා ය.

vi) …………............. ( ගොවියා/ගෙවිළිය) කුඹුරට ගියේ ය.

vii) …………............. (විදුහල්පතිතුමා/විදුහල්පතිවරු) රැස්වීමට සහභාගි වූහ.

viii) …………............. ( දෙමාව්පියන්/දෙමාව්පියෝ) ශ්‍රමදානයට සහභාගි වූහ.

ix) …………............. (මම /අපි) ශිෂ්‍යත්ව විභාගය ඉහළින් සමත් වෙමු.

x) …………............. ( අක්කා/ අයියා) පන්සල් ගියා ය.

## අවබෝධය

**ඡේද ආශ්‍රිත ප්‍රශ්න**

(87) මගේ නිවසේ සුදු පාට හාවෙක් සිටී. මම ඔහුට "බන්ටි" කියා නම් තබා ඇත. බන්ටි කැරට් කෑමට ඉතා කැමතියි.

i). ඡේදයේ සඳහන් හාවාගේ නම කුමක් ද?..................................................................

ii). බන්ටි කෑමට වැඩියෙන්ම කැමති කුමක් ද?..........................................................

(88) අද උදෑසන අහස කළු කර වැස්සක් ඇද හැලුණි. පොළොව තෙමී ගස් කොළන් නැවුම් බවින් යුතුය. විය. මම ජනේලයෙන් පිටත බලා සිටියෙමි. කුඩා දරුවෝ වැස්සේ තෙමෙමින් සතුටු වූහ.

i). අද උදෑසන සිදුවූයේ කුමක් ද? ...........................................................................

ii). දරුවන් කළේ කුමක් ද? ..........................................................................................

(89) මගේ හොඳම මිතුරා කසුන්ය. අපි දෙදෙනාම එකම පන්තියේ ඉගෙන ගනිමු.කසුන්ඉතා දක්ෂ ලෙස චිත්‍ර අඳියි. පාසල් විවේක කාලයේදී අපි දෙදෙනා එකට සෙල්ලම් කරමු.

i). කසුන් දක්ෂ වන්නේ කුමකට ද?.............................................................................

ii).විවේක කාලයේදී ඔවුන් දෙදෙනා කරන්නේ කුමක් ද?...............................................

(90) අපේ පාසලේ ලස්සන වත්තක් ඇත. එහි රතු, කහ සහ සුදු පාට මල් පිපී තිබේ. සමනලයන් මල් මත වසමින් මල් පැණි උරා බොයි. අපි කිසිවෙකුත් මල් කඩන්නේ නැත. වත්තේ ඇති ගස් නිසා අපට හොඳ සෙවනක් ලැබේ.

i).පාසල් වත්තේ ඇති මල්වල පාට මොනවා ද?.........................................................

ii).මල් මත වසන්නේ කවු ද?.........................................................................................

( 91) මම සෑම දිනකම අලුයම 5:00 ට අවදි වෙමි. මුලින්ම මම දත් මැද මුහුණ සෝදා ගනිමි. ඉන්පසු මම පාඩම් කර පාසල් යාමට සූදානම් වෙමි. අම්මා සාදා දෙන උදෑසන ආහාරය ගෙන මම පාසල් යමි. මම පන්තියේදී ඉතා උනන්දුවෙන් ඉගෙන ගනිමි.

i).මම උදෑසන අවදි වන්නේ කීයටද?........................................................................

ii). පාසල් යාමට පෙර මම කරන්නේ කුමක්ද?...........................................................

(92) අපේ ගම ඉතා අලංකාරය. ගම මැදින් ගලා බසිනා කුඩා ඔය දෙස බලා සිටීම ඉතා ප්‍රියජනකයි. ගොවි මහතා කුඹුරේ වැඩ කරන අතර, ගොවි බිරිඳ නිවසේ සිට ආහාර පාන සකසයි. සවස් කාලයේදී කුරුල්ලන් තම කූඩු වෙත පියඹා යයි.

i) . "**ගොවි මහතා**" යන පදයට ගැළපෙන ස්ත්‍රී ලිංග පදය කුමක් ද?.......................................

ii). "**ලස්සන**" යන පදයට සමාන අර්ථයක් දෙන වචනයක් ඡේදයෙන් සොයා ලියන්න. .

.....................................................................................................................................

iii). ගොවි බිරිඳ කරන්නේ කුමක් ද?...............................................................................

(93) වර්ෂා කාලයට අහස කළු පැහැ ගැන්වේ. ගොවියා තම කුඹුරේ බිත්තර වී වපුරයි. වැස්සට තෙමෙන ගස් වැල් නැවුම් ස්වභාවයක් ගනී. ගෙම්බන් හඬන හඬ ඇසෙන විට දරුවෝ ඉතා සතුටු වෙති.

i). "**සුදු**" යන පදයට විරුද්ධාර්ථ පදය ඡේදයෙන් සොයා ලියන්න....................................

ii)"**වර්ෂාව**" යන පදයට සමාන අර්ථයක් ඇති වචනයක් ඡේදයෙන් සොයා ලියන්න

.....................................................................................................................

iii)"**ගෙම්බන්**" යන පදයේ ඒක වචනය කුමක්ද?...........................................................

(94) කැලෑවේ ජීවත් වන සතුන් මෙන්ම අපේ නිවෙස්වල ජීවත් සතුන්ද ඇත. බල්ලා ඉතා විශ්වාසවන්ත සතෙකි. බළලා තම පැටවුන් ඉතා ආදරයෙන් රැකබලා ගනී. අප සතුන්ට කරුණාව දැක්විය යුතුය.

i). මෙහි ඇති සතුන් දෙදෙනෙක් නම් කරන්න................................................................

ii). කැලෑවේ ජීවත් වන්නේ කවු ද?..................................................................................

- කවි ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

(95) කුරුලු රැන් ගී ගයනා - නිල් කඳු ගැට මතින් එන
සිහිල් සුළඟ ඇවිදින් - ගත දවන මහන්සිය නිවන
කළපු දිය රැලි හඬ - මනරම් ගීතයක් විලස
මගේ ගමයි සුන්දර - දෙනෙතට සිසිලස ගෙනෙන

i). මෙහි ගී ගයන්නේ කවු ද?..........................................................................................

ii). සිසිල ගෙන දෙන්නේ කුමකට ද?..................................................................................

iii). පහත වචනවලට ගැළපෙන සමානාර්ථ පද කවියෙන් සොයා ලියන්න.

- සීතල - ...............................................................
- වෙහෙස -...............................................................

iv). මූර්ධජ අකුරක් යෙදුණු වචනයක් ඡේදයෙන් සොයා ලියන්න.....................................

(96) පුංචි සමනලයා ලස්සන - මල් මත ගිහින් නටනවා

පාට පාට පියාපත් - අහසේ රවුම් ගහනවා

මල් පැණි උරා බීලා - සතුටින් උඩ පනිනවා

දකින අපේ දෑසටත් - මහත් සතුටක් ගෙනෙනවා

i) සමනලයා මල් මතට යන්නේ ඇයි?.......................................................................

ii) සමනලයා දකින විට ඔබට දැනෙන හැඟීම කුමක්ද?................................................

iii) සතුට යන්නට විරුද්ධාර්ථ පදය ඡේදයෙන් සොයා ලියන්න. ....................................

iv) මෙහි එන අප්‍රාණවාචි බහු වචන නාමපදයක් ලියන්න…..........................................

(97) අකුරු උගන්නන තැනයි

දැනුම බෙදන තැනයි

මිතුරු මිතුරියන් එක්වී

සෙල්ලම් කරන තැනයි

i). පාසලේදී සිදුවන කාර්යයක් කවිය ඇසුරින් ලියන්න…......................................................

ii). මිතුරු මිතුරියන් පාසලේදී කරන්නේ කුමක්ද?.....................................................................

iii).“ මිතුරා” යන පදයට සමාන අර්ථයක් දෙන පදයක් ලියන්න...........................................

(98) මල් යායේ රොන් සොයනා
බඹරුන් පියාඹා යයි
පාට පාට සමනලුන්
මල් මත නැවතී ඉඳියි
උදෑසනින් හිරු පායයි
මල් කැකුළු පිපී එයි
කුරුල්ලන් මිහිරි නදින්
ගීතයක් ගයයි

i). බඹරුන් කරන්නේ කුමක් ද? ...........................................................................................

ii). මල් මත නැවතී සිටින්නේ කවු ද? ..................................................................................

iii). කුරුල්ලන් කරන්නේ කුමක් ද? .......................................................................................

iv). පහත පදවලට කවියෙහි යොදා ඇති බහුවචන පද ලියන්න.

- මල - ..................................
- සමනලයා - .........................

v). "උදෑසනින් හිරු පායයි." මෙම වාක්‍ය අතීත කාලයට හරවා ලියන්න.

................................................................................................................................................